වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
ANNUAL REPORT
2019

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
பாவனையாளர் அலீவல்கள் அதிகாரசனப
CONSUMER AFFAIRS AUTHORITY

සභාපතිතුමාගේ පණිවිඩය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය ඇතුළත් එම අධිකාරියේ 2019 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව එවීමට හැකිවීම පිළිබඳව මම සතුටට පත්වෙමි. 2019 වර්ෂයේ මුල් භාගයේ දී සිදු වූ පාස්කු ඉරිදා ත්‍රස්තවාදී ප්‍රහාරය නිසා එම වසර කලබලකාරී වසරක් වුවත් අධිකාරිය එම වර්ෂය තුළ ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය සමාලෝචනය කිරීමේ දී තරඟකාරී ව්‍යාපාරික වටපිටාවක් තුළ පාරිභෝගිකයා ආරක්ෂා කිරීමේ ව්‍යවස්ථාපිත අරමුණ උදෙසා දායකත්වය ලබදුන් ක්ෂෙත්‍රවලින් කිහිපයක් පහත දැක්වේ.

තාක්ෂණය දියුණු වී ඇති වර්තමානයේ පාරිභෝගිකයාගේ යහපැවැත්මට සෘණාත්මක ලෙස බලපාන අසාධරණ සහ බාධාකරී වෙළඳ පරිචයන් වැනි විවිධ ගැටළුවලට ඔවුන් මුහුණ දෙති. මෙම වටපිටාව තුළ නීතියෙන් අවසර ලැබී ඇති පරිදි නව නියෝග නිකුත් කරමින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීමට ප්‍රයන්ත අධිකාරිය විසින ගෙන ඇත. ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා රේගුව සමඟ එක්ව රට තුළ ගුණාත්මක භාණ්ඩ ලබාගැනීමට හැකිවීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

එසේම, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ ආර්ථික සංවර්ධන සඳහා ජාතික සභාව යටතේ ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ කමිටු නියෝජනය කර ඇති අතර, පාරිභෝගිකයා ආරක්ෂා කිරීම පිණිස නීති සකස් කරමින් ප්‍රතිපත්තිමය මට්ටමින් ඉහළ දායකත්වයක් ලබා දී ඇත. පාරිභෝගිකයින් සහ වෙළෙන්දන් වැඩිදුරටත් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත සංශෝධනය කිරීමේ කටයුතු ද මේ වන වීට සිදුවෙමින් පවති.

ඊට අමතරව, පාරිභෝගිකයින් සහ වෙළෙන්දන් දැනුවත් කිරීමේ අරමුණ ඇති වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීමට අධිකාරිය මැදිහත් වී ඇති අතර, එමගින් ශ්‍රී ලංකාවේ වර්ධනය වෙමින් පවතින ව්‍යාපාරික වටපිටාව තුළ පාරිභෝගිකයින් මෙන් ම වෙළෙන්දන් යන දෙපාර්ශවයම බලගැන්වීමට හැකිවිය.

2019 වර්ෂයේ දී මහජනතාව සහ වෙළෙන්දන් දැනුවත් කිරීම සඳහා මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් 755 ක්ද වෙළෙන්දන් දැනුවත් කිරීමේ වැඩසටහන් 476 ක්ද අධිකාරිය විසින් පවත්වනු ලැබිය. ඊට අමතරව පාරිභෝගික අයිතීන් සම්බන්ධයෙන් තරුණ පරම්පරාව දැනුවත් කිරීම සඳහා පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 307 ක්ද පවත්වා ඇත. ඒ සමඟම සාර්ථක වෙළඳපොල වැටලීම් 24,061 ක් සිදුකරන ලද අතර, පාරිභෝගිකයින් මුලාවේ දැමූ වෙළෙන්දන්ට විරුද්ධ නඩු 22,475 අධිකරණයේ පවරා ඇත. මෙම නඩුවලින් පනවන ලද දඩ මුදල්වල එකතුව රුපියල් මිලියන 1044 කටත් වැඩිය.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධිකාරියේ විධාන පීඩාවට පත් පාරිභෝගිකයින්ගේ පැමිණිලිවලට මැදිහත් වී කටයුතු සහ යහපත් තරඟකාරී තත්ත්වයක් ප්‍රවර්ධනය කිරීමේ දී ප්‍රති - තරඟකාරී තරඟ විරෝධී චර්යාවන්ට විරුද්ධව වෙළෙන්දන් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කිරීමට අධිකාරිය බලගන්වනු ලබයි. ඒ අනුව 2019 වර්ෂය තුළ දී පාරිභෝගික පැමිණිලි 2464 ක් තුළ ලැබී අතර ඒ සම්බන්ධ පරීක්ෂණ පවත්වා නියෝග නිකුත් කරන ලදී. එසේම හඳුනාගත් පාරිභෝගික භාණ්ඩවල වෙළඳපොල මිළ පාලනය කිරීමට/ ස්ථාවරව පවත්වාගෙන යාමට මැදිහත් වී කටයුතු කරයි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ඉහත සඳහන් කළ සාක්ෂත් කරගැනීම පිළිබඳව මම සතුටට පත්වන අතර, එම සාර්ථකත්වය ලබාගැනීමට උපකාරී වූ අධිකාරියේ කාර්යමණ්ඩලයේ සාමාජිකයින්ට මාගේ කෘතඥතාවය පලකිරීමට මම මෙය අවස්ථාවක් කරගනිමි.

සභාපති

මේජර් ජනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික)

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

දැක්ම

සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ සුරක්ෂිත වූ පාරිභෝගිකයෙකු බිහි කිරීම

මෙහෙවර

පාරිභෝගිකයින් බලගැන්වීම, වෙළඳාම විධිත් කිරීම සහ යහපත් තරඟකාරීත්ව ප්‍රවර්ධනය තුළින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්‍ෂිත කිරීම

ආයතනික අරමුණු

1) වෙළඳාම විධිමත් කිරීම තුළින් වඩාත් තෘප්තිමත් වූ පාරිභෝගිකයින් බිහි කිරීම
2) අසාධාරණ වෙළඳ පිළිවෙත්වලදී පාරිභෝගිකයාට සහන සැලසීම
3) අධ්‍යාපනය සහ දැනුවත් කිරීම තුළින් පාරිභෝගිකයින් සවිබල ගැන්වීම
4) තරඟ විරෝධී චර්යාවන්ට එරෙහිව වෙළෙන්දන් හා සාදන්නන් ආරක්ෂා කරමින් යහපත් තරඟකාරීත්ව ප්‍රවර්ධන කිරීම
5) අධිකාරියෙහි කටයුතු පුළුල් කිරීම තුළින් ආයතනික සංවර්ධනය ළඟා කර ගැනීම

ආයතනික වටිනාකම්

- **විශ්වාසය**

  කාර්යසාධන අනුකූලතාව පවත්වා ගැනීම සහ විශ්වසනියත්වය තහවුරු කිරීම

- **ඍජුභාවය සහ අවංක බව**

  සියලුම කාර්යයන්හි දී අවංකවීම, සාධාරණ වීම සහ යුක්තිගරුක වීම

- **වගකීමට බැඳී සිටීම**

  විනිවිදභාවය ආරක්ෂා කිරීම, වගකිවයුතුබව සහ ඉටුකරනු ලබන සියලුම කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දැරීම

- **කණ්ඩායම් හැඟීම**

  අන්‍යෝන්‍ය අවබෝධය, එකිනෙකාට ගෞරව කිරීම සහ එකිනෙකා අතර විශ්වාසය ගොඩනැංවීම සහ මනා සන්නිවේදනය සහ නම්‍යශීලීභාවය වර්ධනය කරමින් පොදු ඉලක්කයන් කරා ළඟා කරගැනීම උදෙසා සියලුම සේවකයින් එක්ව කටයුතු කිරීම

- **ප්‍රසාදය පළකිරීම**

  සේවකයින්ගේ විශිෂ්ට කාර්යඵල අගය කිරීම සහ ප්‍රශංසා කිරීම

- **අරමුණු ළඟා කරගැනීම සඳහා කැපවීම**

  පවරා ඇති කාර්යයන් කැපවීමෙන් යුක්තව ඉටුකිරීම

- **විශ්වාසනීය ප්‍රතිචාර දක්වීම**

  සේවා සැලසීම සඳහා කැමැත්තක් දක්වීම සහ සූදානම් වීම

- **නිර්මාණශීලීත්වය සහ නව ක්‍රමෝපායන් භාවිතයට ගැනීම**

  සියලුම ක්ෂේත්‍රයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ නව අදහස් උත්පාදනය කිරීම

1 සහ 2 වෙනි මහල,
සතොස මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
අංක 27, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
2021.09.02

සමූපකාර සේවා, අළෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ ගරු රාජ්‍ය අමාත්‍ය

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි,

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාරව විගණනය කරන ලද ශේෂ පත්‍රය, ආදයම් සහ වියදම් ගිණුම් සහ විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟ 2019 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

ස්තුතියි,

මෙයට විශ්වාසී,

මෙජර් ජනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාම)
සභාපති

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
2019 වර්ෂය සඳහා වාර්තාව

අන්තර්ගතය	පිටුව
1. අප ගැන	
1.1 හැඳින්වීම - - - - - - - - -	01
1.2 අධිකාරියේ ව්‍යවස්ථාව - - - - - - - -	01
1.3 අධිකාරියේ කාර්යමණ්ඩලය - - - - - - -	02
1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව - - - - - -	02
2. අධිකාරියේ අරමුණු - - - - - - - -	03
3. අධිකාරියේ කාර්යයන් - - - - - - - -	03
4. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය - - - - - පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව - 2019	04
5. 2019 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය - - - - -	19
6. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය - -	21
7. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සහා මුදල් ගැලීමේ ප්‍රකාශනය - -	22
8. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව -	24
9. විගණකාධිපතිවරයාගේ වාර්තාව සම්බන්ධයෙන් සභාපතිතුමාගේ අදහස් දැක්වීම - -	37

1.1 හැඳින්වීම

1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත, 1987 අංක 1 දරන සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ 1950 මිල පාලන පනත අවලංගු කරමින් සම්මත කරන ලද 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත මඟින් පාරිභොගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

පනතේ පූර්විකාව පරිදි, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සමස්ථ අරමුණ වන්නේ වෙළඳ කටයුතු සහ භාණ්ඩ හා සේවාවන්ගේ මිළ නියාමනය කිරීම තුළින් පාරිභෝගිකයින්ට වඩාත් හොඳ ආරක්ෂාවක් සැලසීම සහ, අසාධාරණ වෙළඳ පරිචයන් හා සීමාකාරී වෙළඳ පරිචයන්ට එරෙහිව කටයුතු කරමින් වෙළෙඳුන් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කිරීම ය. තවදුරටත්, හැකි සෑම තැනකදීම තරඟකාරී මිළ නියම කිරීම් ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර, භාණ්ඩ හා සේවා වෙළඳුන් සහ නිෂ්පාදකයින් අතර යහපත් තරඟකාරි තත්ත්වයක් ඇතිකිරීමටත් වගබලා ගනු ඇත.

1.2 අධිකාරිය පිහිටුවීම

පනතේ විධිවිධාන ප්‍රකාරව අධිකාරිය; සභාපතිවරයෙකුගෙන් සහ පනතින් විශේෂ කොට දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත අය අතුරින් ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් දස දෙනෙකුට නොඅඩු ගණනකින් සමන්විත වේ.

අධිකාරියේ සාමාජිකයින්

2019 වර්ෂයේ අග දක්වා තනතුරු දැරූ සාමාජිකයින්ගේ නම් පහත පරිදි වේ.

1.	ආචාර්ය ලලිත් නිමල් සෙනවීර මහතා	සභාපති	
2.	මේජර් ජනරාල් ඩී.එම්.එස්. දිසානායක මහතා (විශ්‍රාමික)	සභාපති	(2019.12.20 සිට)
3.	ඒ.ආර්.බී. නිහ්මත්ඩීන් මහතා	පූර්ණ කාලීන සාමාජික	
4.	එම්.ඒ. අන්සිල් මහතා	පූර්ණ කාලීන සාමාජික	
5.	වී. ජයතිලක මහතා	පූර්ණ කාලීන සාමාජික	
6.	ඩී.සි.ඩබ්ලිව්. හපුගොඩ මෙය	භාණ්ඩාගාර නියෝජිත	
7.	කේ.ඩී. චිත්‍රපාල මහතා	සාමාජික	
8.	රූබන් වික්‍රමාරච්චි මහතා	සාමාජික	
9.	එම්.ඩී.එම්. රිස්වි මහතා	සාමාජික	
10.	ඩී.ඩබ්ලිව්. ජෝන්දාස මහතා	සාමාජික	
11.	ආචාර්ය ඒ.එල්. ෆරීඩ් මහතා	සාමාජික	
12.	එම්.ටී.ඒ. 'සේන් මහතා	සාමාජික	
13.	ඒ.එම්. මොහොමඩ් රියා'ස් මහතා	සාමාජික	
14.	චමින්ද රෝහණ ගමගේ මහතා	සාමාජික	
15.	ඉන්දිකා රණතුංග මෙය	සාමාජික	(අමාත්‍යාංශයේ නියෝජිත)

1.3 අධිකාරියේ කාර්යමණ්ඩලය

ආචාර්ය ලලිත් එන්. සෙනවීර මහතා 2019 වර්ෂය තුළදී සභාපතිත්වය දරන ලද අතර, 2019.12.20 වෙනි දින සිට මේජර් ජනරාල් ඩී.එම්. ශාන්ත දිසානායක මහතාද (විශ්‍රාමික) සභාපති ධුරයේ කටයුතු හෙබවිය. 2018.09.14 වෙනි දින සිට අධ්‍යක්ෂ ජනරාල් ලෙස එම්.එස්.එම්. ෆවු'සර් මහතාද කටයුතු කරන ලදී.

අධිකාරියේ අංශවල ප්‍රධානීන්

1. දීප්ති තිසේරා මිය එම්.පීජ් (පීඅයිඑම් - ශ්‍රී ජ'පුර) - නීතිඥ අධ්‍යක්ෂ - නීති සහ බලගැන්වීම	2. ඩබ්ලිව්.ඩබ්ලිව්.ඒ.කේ. බණ්ඩාර මහතා විද්‍යාවේදි විශේෂ (තක්සේරු කිරීම) අධ්‍යක්ෂ - පාරිභෝගික කටයුතු හා තොරතුරු 2019.10.01 දින සිට
3. සමන්තා කරුණාරත්න මිය ශාස්ත්‍රවේදී (ආර්ථික) විශේෂ (ගෞරව), එම්.ඒ. (ආර්ථික) අධ්‍යක්ෂ - තරඟකාරී ප්‍රවර්ධන 2019.10.01 දින සිට	4. සම්පත් අංගුළුගහ මහතා වාණිජවේදී (විශේෂ) ගෞරව, එම්ජ්, එම්අයිඑම් (ශ්‍රී ලංකා), ඒඅයිපීඑම් (ශ්‍රී ලංකා), ඒයූකේඒපී, පිරිස් හා මානව සම්පත් කළමණාකරනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, පිරිස් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, අධ්‍යක්ෂ - මානව සම්පත් හා පරිපාලන
5. ඩබ්ලිව්.එම්. ප්‍රියන්ත මහතා එම්පීඑම්, වාණිජවේදී (විශේෂ) ගෞරව, ඒඅයිපීඑෆ්එම්, ඩීපීඑෆ්එඑම්, අධ්‍යක්ෂ - මුල්‍ය	6. නිරංජලා ජෙගනාදන් මෙය ඒසීජ්, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් උපාධිය (ජ'පුර) අධ්‍යක්ෂ - මිළ කිරීම් සහ කළමනාකරණ
7. රසිකා සාවිත්‍රී විජේසේකර මිය විද්‍යාවේදී ගිණුම් (විශේෂ) ගෞරව යුඑස්ජේ, සීබීජ්, එම්ඒඒටී අභ්‍යන්තර විගණක	

1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

මෙම සභාව ස්ථාපනය කර ඇත්තේ වාණිජ නීතිය, වෙළඳ ව්‍යාපාර කළමනාකරණය සහ වෙළඳ පරිචයන් හා පාරිභෝගික කටයුතු පිළිබඳ ක්ෂේත්‍රවල පුළුල් අත්දැකීම් සහිත විශේෂඥයින් තිදෙනෙකුගෙන් සමන්විත වන පරිදි ය. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙම සභාව වෙත යොමු කරනු ලබන සියලූම ඉල්ලීම්වලට යොමු වෙමින් ඒ සම්බන්ධ තීරණ ලබාදීම එහි වගකීම වේ. ඊට අමතරව, පනතේ 38 වෙනි වගන්තිය යටතේ තරඟ විරෝධි චර්යයා සම්බන්ධ පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනය කොට ඒ සම්බන්ධ තීරණ ගැනීමේ වගකීම, පනතේ 19 වෙනි වගන්තිය යටතේ උපරිම සිල්ලර මිළක් නියම කිරීමේ වගකීම සහ පනතේ 19 සහ 20 වෙනි වගන්ති යටතේ අයුතු මිළ ගණන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම මෙම සභාවට පැවරී ඇත.

<u>පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සාමාජිකයින්</u>

රුෂ්ඩි හබීබ් මහතා	-	සභාපති
ආර්.ඒ.එන්.ඒ. රාජපක්ෂ මහතා	-	සමාජික
කේ.ජේ.සී.පී. වික්‍රමරත්න මහතා	-	සාමාජික
නීතිඥ ලේඛා අර්යරත්න මෙය	-	සභාවේ ලේකම් - 2019.01.03 සිට 2019.03.10 දක්වා
නීතිඥ රංගිකා කොන්ඩාරගමගේ මෙය	-	සභාවේ ලේකම් - 2019.08.01

2. අධිකාරියේ අරමුණු

අ. පාරිභෝගිකයින්ගේ ජීවිතවලට සහ ඔවුන්ගේ දේපළට උපද්‍රව සහිත භාණ්ඩ අලෙවියේදී හෝ සේවා සැපයීමේදී ඔවුන්ව ආරක්ෂා කිරීම.

ආ. අසාධාරණ වෙළඳ පරිචයන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ පාරිභෝගික ශුභසිද්ධිය වෙනුවෙන් නිසි සැලකිල්ලක් දක්වනු ලබන බවට වගබලා ගැනීම.

ඇ. හැකි සෑම අවස්ථාවකදීම පාරිභෝගිකයින්ට තරගකාරී මිළ ගණන්වලට භාණ්ඩ හා සේවා ලබාගැනීමට ප්‍රමාණවත් ප්‍රවේශයක් ඇති බවට වගබලා ගැනීම.

ඈ. අසාධාරණ වෙළඳ පරිචයන්ට, සීමාකාරී වෙළඳ පරිචයන්ට හෝ යම් වෙනත් ආකාරයකින් වෙළෙඳුන් විසින් පාරිභෝගිකයින්ව සූරා කෑමට එරෙහිව පිළියම් සෙවීම.

3. අධිකාරියේ කාර්යයන්

1) අධිකාරිය විසින් පහත දෑ පාලනය කිරීම හෝ ඉවත් කිරීම සිදු කරනු ලැබේ.

   අ. ව්‍යවසාය අතර සීමාකාරී වෙළඳ ගිවිසුම්

   ආ. ව්‍යාවසායකයන් අතර මිල පිළිබඳ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම

   ඇ. වෙළඳපොළ ඇතුළත හෝ වෙළඳපොළේ සැලකිය යුතු කොටසක දේශීය වෙළදාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදාගැනීම; හෝ

   ඈ. දේශීය හෝ ජාත්‍යන්තර වෙළඳාමය හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන යම් තරගකාරීත්වය

2) තරග විරෝධී හා ආධිපත්‍ය තත්ත්වයන් අනිසි ලෙස යොදා ගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂණ සිදු කිරීම.

3) භාණ්ඩ හෝ සේවා සපයන තැනැත්තන් අතර ඵලදායි තරගකාරිත්වයක් පවත්වාගෙන ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම.

4) භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබාගතහැකිවීම සහ ඒවායේ තත්ත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන්, පාරිභෝගිකයින්ගේ, මිලදීගන්නන්ගේ සහ භාණ්ඩ සහ සේවා භාවිතා කරන අයගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම.

5) මිලදී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය, ප්‍රමාණය, ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිති සහ මිල පිළිබඳව පාරිභෝගිකයින් දැනුවත් කිරීම.

6) මෙම පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම.

7) වෙළඳපොල තරගකාරීත්වය අඩු ඵලදායීතාවෙන් පවතින අවස්ථාවලදී වෙළෙඳපොළෙහි තරගකාරී මිල ප්‍රවර්ධනය කිරීම.

8) වෙළඳපොල තත්ත්වය සහ පාරිභෝගික කටයුතුවලට සම්බන්ධයෙන් අදාලව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පළ කිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම.

9) රාජ්‍ය සහ පෞද්ලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන භාරගැනීම.

10) පාරිභෝගිකයින්ගේ මනා සෞඛ්‍යය, සුරක්ෂිත බව හා ආරක්ෂාව සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

11) වෙළඳපොල තත්ත්වයන් සහ පාරිභෝගික කටයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමග හුවමාරු කිරීම ප්‍රවර්ධනය කිරීම.

12) පාරිභෝගික සංවිධාන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම, උපකාර කිරීම සහ උනන්දු කිරීම.

13) අධිකාරිය විසින් ලබාදෙනු ලබන යම් සේවාවන් සම්බන්ධයෙන් ගාස්තු අයකිරීම.

14) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය වියහැකි පරිදි කිසියම් ආකාරයක කමිටුවක් හෝ කමිටු පත්කිරීම; සහ

15) අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්තව්‍යය ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කටයුතු ඉටුකිරීම.

4. අධිකාරියේ කාර්යය සාධනය

සංවිධාන ව්‍යුහයට අනුව අධිකාරිය අභ්‍යන්තර විගණන අංශයද ඇතුළුව අධ්‍යක්ෂකවරුන් 6 දෙනෙකු යටතේ මෙහෙයවනු ලබන අංශ 6 කින් සමන්විත වන අතර ඒවා පහත පරිදි වේ.

1) පාරිභෝගික කටයුතු හා තොරතුරු අංශය
2) නීති හා බලගැන්වීමේ අංශය
3) මිළ හා කළමනාකරණ අංශය
4) තරගකාරීත්ව ප්‍රවර්ධන අංශය
5) මූල්‍ය අංශය
6) මානව සම්පත් හා පරිපාලන අංශය
7) අභ්‍යන්තර විගණන අංශය

5. 2019 වර්ෂය තුළ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය පහත පරිදි ඉදිරිපත් කරමු

1. හානිකර මෙන් ම ප්‍රමිතියෙන් තොර භාණ්ඩ සහ සේවාවන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කරගැනීම

අ. පනතේ 10 සහ 12 වෙනි වගන්ති යටතේ නිකුත් කරන ලද නියෝග

නියෝග අංක 68 - නියෝගයේ උපලේඛනයේ නිරූපිතව දක්වා ඇති පරිදි නිෂ්පාදකයින්, ආනයනකරුවන්, බෙදාහරින්නන් සහ වෙළෙඳුන් විසින් සියලුම ද්‍රව්‍ය/භාණ්ඩවල ඇසුරුම්, භාජන හෝ දවටන මත අවශ්‍ය කරනු ලබන තොරතුරු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂායෙන් කියවිය හැකි පරිදි මුද්‍රණය කළ යුතු ය.

නියෝග අංක 69 - පාවෙන මෙහෙයුම් වටිනාකම් (float operated values) සහ අමතර කොටස් නිෂ්පාදකයින්, ආනයනකරුවන් සහ බෙදාහරින්නන් විසින් නියෝග අංක 69 මගින් දක්වා ඇති අවශ්‍ය කරනු ලබන තොරතුරු එක් එක් ඇසුරුම මත කියවිය හැකි සහ නොමැකෙන පරිදි භාෂා තුනෙන්ම මුද්‍රණය කළ යුතු ය.

නියෝග අංක 70 - ආහාර දවටන (Lunch Sheets) භාවිතා කරමින් නිෂ්පාදනය කරනු ලබන සෑම සහ එක් එක් ඇසුරුම හෝ මිටිය (bundle) මත නියෝග අංක 70 මගින් දක්වා ඇති අවශ්‍ය කරනු ලබන තොරතුරු එකී දවටන නිෂ්පාදකයින් සහ වෙළෙඳුන් විසින් භාෂා තුනෙන්ම අන්තර්ගත වන පරිදි ලේබලයක් මුද්‍රණය කළ යුතු ය.

නියෝග අංක 71 - නියෝග අංක 71 මගින් විශේෂ කොට දක්වා ඇති පරිදි සියලූම නිෂ්පාදකයින්, ආනයනකරුවන්, බෙදාහරින්නන් සහ වෙළෙඳුන් විසින් සියලූම ද්‍රව්‍ය/භාණ්ඩවල දවටන මත අවශ්‍ය කරනු ලබන තොරතුරු භාෂා තුනෙන්ම කියවිය හැකි පරිදි මුද්‍රණය කළ යුතු ය.

ආ. පනතේ 20(5) වෙනි වගන්තිය යටතේ නිකුත් කර ඇති නියෝග

නියෝග අංක 54 - සහල් ප්‍රභේද තුන සඳහා නියෝග අංක 54 මගින් නියම කොට ඇති උපරිම සිල්ලර මිළට වඩා වැඩි මිළකට විකිණීම, නිරාවරණය කිරීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නිෂ්පාදකයෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් නොකළ යුතු ය.

නියෝග අංක 11 - 2014 මාර්තු 04 දිනැති අංක 1852/22 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් මගින් ප්‍රසිද්ධ කර ඇති නියෝග අංක 10 අවලංගු කරන ලදි.

නියෝග අංක 55 - 2017 දෙසැම්බර් 06 දිනැති අංක 2048/30 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රසිද්ධ කර ඇති නියෝග අංක 48 හි "පොල්" යන අයිතමය ඉවත් කරන ලදි.

නියෝග අංක 56 - සහල් ප්‍රභේද දෙක සඳහා නියෝග අංක 56 මගින් නියම කොට ඇති උපරිම සිල්ලර මිළට වඩා වැඩි මිළකට විකණීම, නිරාවරණය කිරීම හෝ විකණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නිෂ්පාදකයෙකු, ආනයනකරුවෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් නොකළ යුතු ය.

නියෝග අංක 57 - සිමෙන්ති ප්‍රභේද තුන සඳහා නියෝග අංක 57 මගින් නියම කොට ඇති උපරිම සිල්ලර මිළට වඩා වැඩි මිළකට විකිණීම, නිරාවරණය කිරීම හෝ විකණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නිෂ්පාදකයෙකු, ආනයනකරුවෙකු, ඇසුරුම්කරුවෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් නොකළ යුතු ය.

ඇ. ගුණාත්මක භාවයෙන් අඩු ආනයනික භාණ්ඩ නිරීක්ෂණය කිරීම

ගුණාත්මක භාවයෙන් අඩු භාණ්ඩ රට තුළට ගෙන ඒමට තිබෙන ස්ථාන ඔස්සේ රට තුළට පැමිණීම වැළැක්වීම පිණිස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා රේගුව සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. එවැනි අවස්ථා 97 ක් නිරීක්ෂණය කරනු ලැබූ අතර, එම භාණ්ඩ ආනයනික පරීක්ෂණ යෝජනාක්‍රමය යටතේ වන ප්‍රමිතීන්ට අනුකූල නොවන නිසා ඒවා ප්‍රති - අපනයනය කළ යුතු බවට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිර්දේශ කරන ලදි.

ඈ. පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ජාතික කමිටු නියෝජනය කළ අතර, ප්‍රතිපත්ති හඳුන්වාදීමට / නීති සම්පාදනය කිරීමට දායකත්වය ලබාදෙන ලදි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සෞඛ්‍ය අමාත්‍යාංශය, තාක්ෂණික හා පර්යේෂණ අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, බලශක්ති අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික සභාව යටතේ මෙහෙයවනු ලබන ජාතික මට්ටමේ කමිටු නියෝජනය කරනු ලබන අතර, පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති හඳුන්වාදීමට / නීති සම්පාදනය කිරීමට දායකත්වය ලබාදෙයි.

2. රැවටිලිකාර කල්ක්‍රියා සහ අසාධාරණ වෙළඳ පරිචයන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම

අ. ව්‍යාපාරික ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්

අනතුරට භාජනය වියහැකි කණ්ඩායම් ආරක්ෂා කරමින්, ඉහළට ගෙන එමින් සහ බලගන්වමින් සිවිල් සමාජයේ සුභසාධනය වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීමට ඇති වඩාත් ඵලදායි මාර්ගය වේ. ප්‍රකල්පිත හා නිර්මිත වෙළෙඳුන් දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් මෙය ක්‍රියාත්මක කර ඇත.

2019 වර්ෂය තුළදී අධිකාරිය විසින් ව්‍යාපාරික ප්‍රජාව සඳහා වැඩසටහන් 476 ක් පවත්වා ඇත.

වගුව - 1 : 2019 වර්ෂය තුළදී පවත්වන ලද වෙළෙඳුන් දැනුවත් කිරීමේ වැඩසටහන්

පළාත	දිස්ත්‍රික්කය	වෙළෙඳුන් දැනුවත් කිරීමේ වැඩසටහන්
		වැඩසටහන් ගණන
මධ්‍යම පළාත	මහනුවර	19
	මාතලේ	30
	නුවර එළිය	26
නැගෙනහිර පළාත	අම්පාර	23
	මඩකලපුව	10
	ත්‍රිකුණාමලය	04
උතුරු මැද පළාත	අනුරාධපුරය	04
	පොළොන්නරුව	03
උතුරු පළාත	යාපනය	08
	කිලිනොච්චිය	44
	මන්නාරම	26
	මුලතිව්	21
	වවුනියාව	33
වයඹ පළාත	කුරුණෑගල	10
	පුත්තලම	90
සබරගමුව පළාත	කෑගල්ල	04
	රත්නපුරය	09
දකුණු පළාත	ගාල්ල	09
	හම්බන්තොට	07
	මාතර	28
ඌව පළාත	බදුල්ල	01
	මොණරාගල	28
බස්නාහිර පළාත	කොළඹ	09
	ගම්පහ	07
	කළුතර	23
එකතුව		476

ආ. වෙළඳපොල වැටලීම් සහ විමර්ශන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ලේබල් කිරීමේ උපදෙස් උල්ලංඝනය කිරීම, වෙළඳපොලේ පවතින මිළට වැඩි මිළකට විකිණීම, භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ ළඟ තබාගැනීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සඟවා තබාගැනීම, අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය රහිතව සමහර භාණ්ඩවල සිල්ලර හෝ තොග මිළ වැඩිකිරීම, මිල ලැයිස්තුවක් ප්‍රදර්ශනය නොකිරීම, ගැනුම්කරුවන්ට ලදුපතක් නිකුත් නොකිරීම, නිෂ්පාදකයින්/වෙළෙඳුන් විසින් සිදුකරනු ලබන නොමඟ යැවීම් හෝ රැවටිලිකාර කල්ක්‍රියා සහ ව්‍යාජ නිදේශනය සම්බන්ධ වැටලීම් අධිකාරිය විසින් සිදුකරනු ලැබේ. වැරදි කරනු ලබන වෙළෙඳුන්ට එරෙහිව අනුපිළිවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනු ලබන අතර, පනතේ 60 වෙනි වගන්තියෙන් ලබාදී ඇති විධිවිධාන පදනම් කරගෙන දඩ මුදල් නියම කරනු ලැබේ.

වගුව - 2 ፡ වෙළඳපොල වැටලීම්වල ප්‍රගතිය සහ පනවන ලද දඩ මුදල්

සිදුකරන ලද ක්‍රියාකාරකම් (ඉලක්කය)	වැටලීම් ගණන	අවස්ථා ගණන	පනවන ලද දඩ මුදල් ප්‍රමාණය (රු.)
වෙළඳපොල වැටලීම් සහ විමර්ශන - 10 වෙනි වගන්තිය මත සිදුකරන ලද වෙළඳපොල විමර්ශන (10 වෙනි ඡේදය යටතේ නිකුත් කරන ලද නියෝග උල්ලංඝනය කිරීම)	**9,481**	**9,021**	**45,831,400**
- 11 වෙනි වගන්තිය මත සිදුකරන ලද වෙළඳපොල විමර්ශන (වෙළඳපොල මිළට වඩා වැඩි මිළකට විකිණීම)	**260**	**219**	**1,093,700**
- 12 වෙනි වගන්තිය මත සිදුකරන ලද වෙළඳපොල විමර්ශන (ප්‍රමිතයන්ට අනුකූල නොවීම)	**691**	**574**	**3,258,000**
- 15 වෙනි වගන්තිය මත සිදුකරන ලද වෙළඳපොල විමර්ශන	**2**	**1**	**6,000**
- 16 වෙනි වගන්තිය මත සිදුකරන ලද වෙළඳපොල විමර්ශන (යම් භාණ්ඩ ළඟ තබාගැනීම ප්‍රතික්ෂේප කිරීම)	**24**	**24**	**103,000**
- 17 වෙනි වගන්තිය මත සිදුකරන ලද වෙළඳපොල විමර්ශන (භාණ්ඩ සඟවා තැබීම)	**2**	**-**	**-**
- 18 වෙනි වගන්තිය මත සිදුකරන ලද වෙළඳපොල විමර්ශන (එම්ආර්පී මත උල්ලංඝනය කිරීම)	**21**	**7**	**79,500**
- 20 වෙනි වගන්තිය මත සිදුකරන ලද වෙළඳපොල විමර්ශන	**2,246**	**1,929**	**8,134,800**
- 26 වෙනි වගන්තිය මත සිදුකරන ලද වෙළඳපොල විමර්ශන (මිළ දර්ශනය ප්‍රදර්ශනය නොකිරීම)	**6,544**	**6,094**	**18,970,100**
- 28 වෙනි වගන්තිය මත සිදුකරන ලද වෙළඳපොල විමර්ශන (වෙළෙඳුන් විසින් ගැනුම්කරුවන් වෙත ලදුපත් නිකුත් කිරීමට)	**12**	**13**	**26,000**
- 30 වෙනි වගන්තිය මත සිදුකරන ලද වෙළඳපොල විමර්ශන (රැවටිලිකාර හෝ කූඨ කල්ක්‍රියාවන්)	**2,454**	**2,416**	**15,110,000**
- 30 සහ 31 වෙනි වගන්ති මත සිදුකරන ලද වෙළඳපොල විමර්ශන (රැවටිලිකාර සහ ව්‍යාජ නිදේශන)	**1,277**	**1,167**	**6,964,000**
- 31 වෙනි වගන්තිය මත සිදුකරන ලද වෙළඳපොල විමර්ශන (ව්‍යාජ නිදේශනය)	**1,047**	**1,010**	**4,824,000**
මුළු වැටලීම් ගණන සහ දඩ මුදල් ප්‍රමාණය	**24,061**	**22,475**	**104,400,500**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදුකරනු ලැබූ විශේෂ වැටලීම්

කල් ඉකුත්වූ සහල් තොග ගබඩා කර තැබූ

පොළොන්නරුවේ මහ පරිමාණ සහල් ගබඩාවට මුද්‍රා තැබේ

■ මැනම්පිටිය - නිමල් ජයරත්න

කල් ඉකුත්වූ සහල් තොග ගබඩා කිරීම ඇතුළු චෝදනා තුනක් සම්බන්ධයෙන් පොළොන්නරුව වැලිකන්ද සිංහපුර ප්‍රදේශයේ මහා පරිමාණ සහල් ගබඩාවකට ඊයේ (27දා) සවස මුද්‍රා තබා එසා දැමීමට පියවර ගත් බව පොළොන්නරුව පාරිභෝගික

සහිත අසුරන හොඳ සහල් සමග මිශ්‍රව ගබඩා කර තැබීම, කල් ඉකුත්වූ සහල් ඇසුරුම්වල මුද්‍රණ වෙනස් කිරීම, උපරිම සිල්ලර මිලට වඩා වැඩි මිලක් සඳහන් කර තැබීම යන චෝදනා යටතේ සහල් මෝල් හිමිකරුට විරුද්ධව පොළොන්නරුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට තීරණය කර ඇති බව චන්ද්‍රකුමාර මහතා

කිලෝ 98,000ක් ඇතුළුව සහල් කිලෝ 245,000කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තිබූ බවත් එම සහල් සියල්ල එම ගබඩාවෙම මුද්‍රා තබා පොලිස් භාරයේ රඳවා තිබෙන බවද චන්ද්‍රකුමාර මහතා

පරීක්ෂකවරුන් හරහා රජයේ රස පරීක්ෂකවරයා වෙත යොමුකර ඇති බවත් අදාළ පරීක්ෂණ කටයුතු නිමවන තෙක් එම සහල් මෝලේ නිෂ්පාදන කටයුතු අත්හිටුවීමට පියවර ගෙන තිබෙන බවද චන්ද්‍රකුමාර මහතා සඳහන් කරයි.

කොළඹ පාරිභෝගික සේවා අධිකාරියේ ප්‍රධාන ... අසේල බණ්ඩාර, සහකාර අධ්‍යක්ෂ තාරක විද්‍යානන්ද ... යන මහත්වරුන්ගේ උපදෙස් මත පොළොන්නරුව පාරිභෝගික සේවා අධිකාරියේ ... පී.සී.චන්ද්‍රකුමාර මහතාගේ මෙහෙයවීමේ ... නිලධාරී බී.එම්. ... ඇතුළු සී.එම්. ... සුබසිරි, එස්.එම්. ... එම්. මිහිරාන්, යන ...

සනීපාරක්ෂක තුවා ජාවාරමක්

කල් ඉකුත්වූ බව දැක්වෙන පරණ ඇසුරුම් ඉවත් කොට අලුත් ඇසුරුම් යොදලා

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදුකරනු ලැබූ වැටලීම්

<u>2019 වර්ෂය තුළදී සිදුකරන ලද වැටලීම්</u>



පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් නියම කරන ලද දඩ මුදල්

<u>2019 වර්ෂය තුළදී අධිකරණ විසින් නියම කරන ලද දඩ මුදල්</u>



3. අසාධාරණ වෙළඳ පරිචයන් නිසා බලපෑමට ලක්වූ පාරිභෝගිකයින්ට සහන සැලසීම

පාරිභෝගික පැමිණිලි විමර්ශනය කිරීම

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 13 සහ 32 වෙනි වගන්තිවලින් ලබාදී ඇති විධිවිධාන පදනම් කරගෙන පාරිභෝගිකයින් විසින් යොමු කරනු ලබන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා අධිකාරිය මැදිහත් වේ. නිෂ්පාදක හෝ වෙළෙන්දා විසින් ලබාදී ඇති ප්‍රතීයමාණ හෝ වෙනත් හැටියකින් ලබාදී ඇති වගකීමට හෝ සහතිකවීමට අනුකූල නොවන ලෙසින් භාණ්ඩ විකිණීම හෝ සේවා සැපයීම සම්බන්ධ පැමිණිලි අධිකාරියට විමර්ශනය කළ හැකි ය.

2019 වර්ෂය තුළදී සිදුකරන ලද පාරිභෝගික පැමිණිලි විමර්ශනවල ප්‍රගතිය වගු අංක 3 සහ 4 මගින් ඉදිරිපත් කර ඇත.

වගුව - 3 : පාරිභෝගික පැමිණිලි විමර්ශනය කිරීම

	එකතුව
ලැබුණ මුළු පැමිණිලි ගණන	2464
(අ) තැපැල මගින්	1619
(ආ) දුරකථනය ඔස්සේ	845
වැටලීම් (ප්‍රධාන කාර්යාලය/දිස්ත්‍රික් කාර්යාලය)	882
අනිකුත් ආයතනවලට යොමු කරන ලද	277
විමර්ශනය සඳහා යොමු කරන ලද පැමිණිලි	151
පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් සිදුකරන ලද සාකච්ඡා සහ විමර්ශනයට පෙර සිදුකරන ලද සාකච්ඡා	1430
සාකච්ඡා කිරීමෙන් පසුව බේරුම් කරන ලද	728

(පෙර වර්ෂයේ පැමිණිලිද ඇතුළුව)

වගුව - 4 : පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශන

මහජන පැමිණිලි ප්‍රකාරව පවත්වන ලද විමර්ශන	
පවත්වන ලද විමර්ශන ගණන	281
බේරුම් කරන ලද විමර්ශන	105
නියෝග නිකුත් කරන ලද	23

අධිකරණයේ පවරන ලද නඩු

වර්ගය	2019
අනුකූලතා සහ බලාත්මක කිරීම මගින් ගොනු කරන ලද අලුත් නඩු	19
අධිකරණයේ පෙනී සිටීම්	364
දඩ මුදල් (උසාවි නඩුවලින් ලද)	රු. 100,000/-

4. පාරිභෝගික අධ්‍යාපනය සහ බලගැන්වීම

අ. පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන්

මහජනතාවගේ පාරිභෝගික අයිතිවාසිකම් සහ වගකීම්, වර්තමාන පාරිභෝගික නීතිය, හොඳ පාරිභෝගික වටිනාකම් සහ හොඳ ව්‍යාපාරික පරිචයන් සම්බන්ධයෙන් ඔවුන්ට අධ්‍යාපනයක් ලබාදීම පිණිස විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය, සම්මන්ත්‍රණ සහ වැඩමුළු, ප්‍රදර්ශන ආදිය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් භාවිතා කරනු ලබයි. ඉහත වැඩසටහන්වලට අමතරව, පාරිභෝගික කණ්ඩායම් සහ ව්‍යාපාරික ප්‍රජාවගේ සහභාගිත්වය ඇතිව පාරිභෝගික අයිතිවාසිකම් දිනය සමරනු ලබයි. පනතේ දැක්වෙන පාරිභෝගික අයිතිවාසිකම් සහ සම්බන්ධ වැඩසටහන් දිවයින පුරා පවත්වනු ලැබීය.

වගුව - 5 ៖ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

පළාත	දිස්ත්‍රික්කය	වෙළෙඳුන් දැනුවත් කිරීම	මහජනතාව	පාසැල් දැනුවත් කිරීම
මධ්‍යම පළාත	මහනුවර	19	31	9
	මාතලේ	30	17	2
	නුවර එළිය	26	16	1
නැගෙනහිර පළාත	අම්පාර	23	95	82
	මඩකලපුව	10	68	72
	ත්‍රිකුණාමලය	4	14	10
උතුරු මැද පළාත	අනුරාධපුරය	4	31	1
	පොළොන්නරුව	3	11	1
උතුරු පළාත	යාපනය	8	32	7
	කිලිනොච්චිය	44	25	4
	මන්නාරම	26	18	6
	මුලතිව්	21	16	5
	වවුනියාව	33	29	70
වයඹ පළාත	කුරුණෑගල	10	25	7
	පුත්තලම	90	50	21
සබරගමුව පළාත	කෑගල්ල	4	16	3
	රත්නපුරය	9	10	2
දකුණු පළාත	ගාල්ල	9	32	6
	හම්බන්තොට	7	14	2
	මාතර	28	53	8
ඌව පළාත	බදුල්ල	1	33	9
	මොණරාගල	28	45	23
බස්නාහිර පළාත	කොළඹ	9	40	9
	ගම්පහ	7	15	4
	කළුතර	23	19	5
එකතුව		476	755	307

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

5. ප්‍රති-තරගකාරී පරිචයන්ගෙන් වෙළෙඳුන් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කිරීම සහ යහපත් තරගකාරිත්වයක් ප්‍රවර්ධනය කිරීම

ක්‍රියාකාරකම	එකතුව
<u>වෙළඳාම් කටයුතු සම්බන්ධයෙන් ලද පැමිණිලි විමර්ශනය කිරීම</u>	
ප්‍රති-තරඟකාරී සහ අසාධාරණ වෙළඳ පරිචයන් සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත කරන ලද පැමිණිලිවලට මැදිහත්වීම	
• පෙර කාලපරිච්ඡේදයෙන් ලද පැමිණිලි	10
• කාලපරිච්ඡේදය තුළ ලද පැමිණිලි	35
• සභාව වෙත මාරු කරන ලද පැමිණිලි	01
• කාලපරිච්ඡේදය තුළ අවසන් කරන ලද පැමිණිලි	28
• විමර්ශනය කරමින් පවතින පැමිණිලි	23
සැමදෙනාටම සාර්ථක වීම සඳහා අවස්ථා උදා කරමින් තරගකාරීත්වය වැඩි කිරීම	
අංක 1505/15 දරණ 2007.07.11 දිනැති ගැසට් නිවේදනය යටතේ දැනට හඳුනාගෙන ඇති නිෂ්පාදන පහක් සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම	
• ලැබුණු ඉල්ලුම්පත් ගණන	328
• කටයුතු කරන ලද ඉල්ලුම්පත් ගණන	328
<u>අත්‍යාවශ්‍ය වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් සිදුකරන ලද මිළ ගණන් සමීක්ෂණය කිරීම</u>	
• කොළඹ සහ නගර හාත්පස ප්‍රදේශවල අත්‍යාවශ්‍ය වෙළඳභාණ්ඩ පදනම් කරගත් වාර්තාව	12
• දිස්ත්‍රික්ක මට්ටමින් දත්ත විශ්ලේෂණය සහ වාර්තා කිරීම	12
<u>ආහාර වෙළඳ භාණ්ඩ සම්බන්ධ මිළ ගණන් නිරීක්ෂණය කිරීම - වාර්තා ගණන</u>	
• එළවලුවල දෛනික සිල්ලර මිළ සම්බන්ධ වාර්තා	121
• අත්‍යාවශ්‍ය භාණ්ඩවල සිල්ලර මිළ සම්බන්ධ වාර්තා	121
• විශේෂ මිළ ගණන් සම්බන්ධ වාර්තා	174
පර්යේෂණ අධ්‍යයන	01
විශේෂ අධ්‍යයන	05
වෙළඳපොල ව්‍යුහය හඳුනා ගැනීම	01 වාර්ෂික වාර්තාව (2018) 01 අර්ධ වාර්ෂික වාර්තාව (2019)
වෙළෙඳුන් දැනුවත් කිරීම	07

අන්තර්ක්‍රියාකාරී ජංගම සේවය (1977)

අන්තර්ක්‍රියාකාරී ජංගම සේවා ප්‍රතිචාරය තුළින් පුරවැසියන් සඳහා සිල්ලර මිළ තොරතුරු (කෙටි සංකේත දුරකථන අංකය 1977)

අංක 1977 දරණ අධිකාරියේ කෙටි සංකේත දුරකථනය ඔස්සේ සහ අන්තර්ක්‍රියාකාරී ජංගම සේවා සිල්ලර වෙළඳපොල (කොළඹ පිටකොටුව, දෙමටගොඩ, බොරැල්ල, නුගේගොඩ සහ වැල්ලවත්ත) තුළින් අධිකාරිය විසින් අඛණ්ඩව සේවා සපයා ඇති අතර එමගින් එළවලු, පළතුරු සහ ආහාර ද්‍රව්‍යවල සිල්ලර මිළ දිනපතා එක්රැස් කරනු ලැබේ. මාළු මිළ රැස්කර ගනු ලබන්නේ පැලියගොඩ වෙළඳපොලෙනි. මේවා දිනපතා පද්ධතිය තුළට අත්පතනය කරනු ලැබේ (upload). මෙම තොරතුරු පාරිභෝගිකයින් වෙත දැනුම්දීමෙන් සිය මිළදී ගැනීම්වලදී තීරණ ගැනීමට ඔවුන්ට හැකියාව ලැබේ. අනිකුත් නියාමන අධිකාරීන් සහ හවුල්කාර සංවිධාන සමඟ ඵලදායි සම්බන්ධතා ඇතිකර ගැනීම සහ පවත්වා ගැනීම.

වෙනත් නියාමන අධිකාරියෙන් සහ පාර්ශවකාර සංවිධාන සමඟ ඵලදායී සම්බන්ධතා ඇතිකරගැනීම සහ පවත්වා ගැනීම

1. ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති උපදේශක කමිටුව - ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
2. කළමනාකරන පද්ධති සහතික කිරීමේ කමිටුව - ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
3. ශ්‍රී ලංකාව තුළ පොලිතීන් සහ ප්ලාස්ටික් භාවිතය තහනම් කිරීම සහ පාලනය කිරීම බලාත්මක කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා වන කමිටුව - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
4. පාරිසරික ශබ්ද කළමනාකරණ හා ශ්‍රී ලංකාව තුළ පොලික්ලෝරිනීකෘත බයිෆෙනිල් (PCB) අපද්‍රව්‍ය සහ PCB වලින් දූෂිත/අන්තර්ගත උපකරණ බැහැර කිරීමේ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
5. HCFC මොන්ට්‍රියානු මුල් කෙටුම්පත ශ්‍රී ලංකාව තුළ භාවිතය වෙනුවෙන් පියවර ගැනීමට අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම තවදුරටත් ශක්තිමත් කිරීමේ රෙගුලාසි හඳුන්වාදීමේ කමිටුව - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
6. ශ්‍රී ලංකාව තුළ අපද්‍රව්‍ය කළමනාකරණය උදෙසා නිෂ්පාදකගේ/වෙළෙන්දාගේ හා පාරිභෝගිකයාගේ පුළුල් වගකීමට අදාල මූලධර්ම ක්‍රියාත්මක කිරීමේ කමිටුව - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
7. ශ්‍රී ලංකාව තුළ කර්මාන්ත රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන තාක්ෂණික උපදේශක කමිටුව (TACMIC) - මධ්‍යම පරිසර අධිකාරිය
8. බේසල්, රොටර්ඩෑම්, ස්ටොක්හෝම් සහ මිනමේටි සම්මුතියට අනුව පිහිටුවනු ලැබූ කමිටුව - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
9. ශ්‍රී ලංකා ජාතික විද්‍යුත් තාක්ෂණ කමිටුව - ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
10. ජාතික රසායන ද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය සකස් කිරීමේ හවුල්කාර කමිටුව - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
11. ආරක්ෂක තොප්පි (Helmets) සම්බන්ධ ශ්‍රී ලංකා ප්‍රමිතීන් සංශෝධනය කිරීමේ කාර්ය කණ්ඩායම
12. රාජ්‍ය ගිණුම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද විගණන වාර්තාවේ දැක්වෙන කරුණු ක්‍රියාත්මක කිරීම පදනම් කරගනිමින් විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමේ කමිටුව - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
13. රසායනික ද්‍රව්‍ය හේතුවෙන් සිදුවන අනතුරු වැළැක්වීමේ සහ සූදානම්වීමේ කමිටුව - මධ්‍යම පරිසර අධිකාරිය
14. බේසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ තාක්ෂණික විද්වත් කමිටුව - මධ්‍යම පරිසර අධිකාරිය
15. ජාතික පෝෂණ ප්‍රතිපත්තිය සම්බන්ධ කමිටුව - සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
16. ජීවන වියදම් කමිටු රැස්වීම - මුදල් අමාත්‍යාංශය
17. ආහාර උපදේශන කමිටුව - සෞඛ්‍ය අමාත්‍යාංශය

සාධාරණ මිලකරණයක් සහතිකවීම

අ. පනතේ 18, 19 සහ 20 වෙනි ඡේදවලින් පවරා ඇති බලය පදනම් කරගෙන හඳුනාගත් පාරිභෝගික භාණ්ඩවල වෙළඳපොල මිළ සම්බන්ධව කටයුතු කිරීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මැදිහත් වේ. තෝරාගත් පාරිභෝගික භාණ්ඩවල මිළ තහවුරු කිරීම/ නියම කිරීම වෙනුවෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පහත දැක්වෙන වගු අංක - 7 මගින් ඉදිරිපත් කරනු ලැබේ.

වගුව - 7 : තෝරාගත් භාණ්ඩවල මිළ ස්ථායීකරණය/නියම කිරීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග. නිකුත් කරන ලද තීරණ ගණන

වෙළඳ භාණ්ඩය	තීරණ ගණන
ගෑස්	ගෑස් ඉල්ලුම්පත් 04 ක් සඳහා තීරණ නිකුත් කර ඇත.
සිමෙන්ති	සිමෙන්ති ඉල්ලුම්පත් 16 ක් සඳහා තීරණ නිකුත් කර ඇත.
සම්පූර්ණ යොදය සහිත කිරිපිටි	සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ඉල්ලුම්පත් 18 ක් සඳහා තීරණ නිකුත් කර ඇත.
මේදය රහිත කිරිපිටි	මේදය රහිත කිරිපිටි ඉල්ලුම්පත් 01 ක් සඳහා තීරණ නිකුත් කර ඇත.
තිරිඟු පිටි	තිරිඟු පිටි ඉල්ලුම්පත් 01 ක් සඳහා තීරණ නිකුත් කර ඇත.
ටින් කළ මාළු	ටින් කළ මාළු ඉල්ලුම්පත් 01 ක් සඳහා තීරණ නිකුත් කර ඇත.

ලැබුණු ඉල්ලුම්පත් ගණන

අයිතම	ඉල්ලුම්පත් ගණන
සිමෙන්ති	24
සම්පූර්ණ යොදය සහිත කිරිපිටි	06
ළදරු කිරිපිටි	01
මේදය රහිත කිරිපිටි	01
ගෑස්	03
තිරිඟු පිටි	01
ටින් කළ මාළු	01

නිකුත් කරන ලද අතුරු නියෝග ගණන

අයිතම	ඉල්ලුම්පත් ගණන
සිමෙන්ති	13
සම්පූර්ණ යොදය සහිත කිරිපිටි	02
මේදය රහිත කිරිපිටි	01
තිරිඟු පිටි	01
ටින් කළ මාළු	01

ආයතනයේ ශක්‍යතා වැඩිදියුණු කිරීම

සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර

තනතුර	වැටුප් කේතය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	
			ස්ථිර	තාවකාලික /කොන්ත්‍රාත්
ජ්‍යෙෂ්ඨ කළමනාකාර				
අධ්‍යක්ෂ ජනරාල්	**HM 2-1**	**1**	**1**	**0**
අධ්‍යක්ෂකවරුන්/සභාවේ ලේකම්	**HM 1-1**	**7**	**5**	**0**
කළමනාකාර				
අභ්‍යන්තර විගණක	**MM 1-1**	**1**	**1**	**0**
නියෝජ්‍ය අධ්‍යක්ෂ		**12**	**1**	**0**
සහකාර අධ්‍යක්ෂ			**4**	**0**
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ කලාපීය කටයුතු පිළිබඳ සහකාර අධ්‍යක්ෂවරුන්		**12**	**6**	**0**
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සාමූහික සන්නිවේදන)		**1**	**0**	**0**
කණිෂ්ඨ කළමනාකාර				
විගණන නිලධාරි	**JM 1-1**	**2**	**2**	**0**
පද්ධති පරිපාලක		**1**	**0**	**0**
ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි		**27**	**27**	**0**
ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරි		**1**	**0**	**0**
ජ්‍යෙෂ්ඨ අලෙවි පර්යේෂණ විශ්ලේෂක		**1**	**0**	**0**
ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරි		**2**	**1**	**0**
රහස්‍ය ලේකම් (සභාපති)		**1**	**1**	**0**
රහස්‍ය ලේකම් (අධ්‍යක්ෂ ජනරාල්)		**1**	**0**	**0**
ජ්‍යෙෂ්ඨ පරිපාලන/ මානව සම්පත් නිලධාරි		**1**	**0**	**0**
නීති සහ බලගැන්වීමේ ජ්‍යෙෂ්ඨ නිලධාරි		**2**	**1**	**0**
ජ්‍යෙෂ්ඨ පිරිවැයකරණ නිලධාරි		**1**	**1**	**0**
බලගැන්වීමේ/මෙහෙයුම්/පුළුල් කිරීම්				
දත්ත සම්බන්ධීකාරක	**MA 5-2**	**1**	**0**	**0**
සංඛ්‍යාන නිලධාරි		**1**	**1**	**0**
අලෙවි පර්යේෂණ විශ්ලේෂක		**1**	**1**	**0**
ප්‍රලේඛන නිලධාරි II		**6**	**3**	**0**
පුස්තකාලයාධිපති		**1**	**1**	**0**
පිරිවැයකරණ නිලධාරි		**15**	**2**	**0**
ගිණුම් නිලධාරි			**6**	**0**
පරිපාලන නිලධාරි II		**5**	**3**	**0**
නීති සහ බලගැන්වීමේ ජ්‍යෙෂ්ඨ නිලධාරි		**6**	**6**	**0**
විමර්ශන නිලධාරි		**450**	**373**	**0**
මාධ්‍ය නිලධාරි (කොන්ත්‍රාත් පදනම යටතේ)		**1**	**-**	**0**
කලමනාකාර සහකාර (තාක්ෂණික)				
පොත් තබන්නා	**MA 2-2**	**1**	**0**	**0**
කැමරා ශිල්පි (කොන්ත්‍රාත් පදනම යටතේ)		**1**	**-**	**0**
කලමනාකාර සහකාර (තාක්ෂණික නොවන)				
කලමනාකාර සහකාර	**MA 1-2**	**51**	**43**	**1**

ප්‍රාථමික මට්ටම (පුහුණු)				
රියදුරු	**PL 3**	**28**	**26**	**1**
ප්‍රාථමික මට්ටම (නුපුහුණු)				
කාර්යාල කාර්ය සහායක	**PL 1**	**24**	**22**	**1**
කාර්යාල කාර්ය සහායක (කොන්ත්‍රාත් පදනම යටතේ)		**1**	**-**	**0**
එකතුව		**667**	**540**	**2**

අ. කාර්ය මණ්ඩලය වැඩිදියුණු කිරීම

කාර්ය මණ්ඩලයේ ඒ ඒ සේවකයාට අදාල ක්ෂේත්‍රයේ වැඩිදියුණුව, අපගේ සේවාවන්ගේ ගුණාත්මකභාවය නැංවීමට දායක වන ආයෝජනයක් බව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සලකයි. 2019 වර්ෂ තුළ පවත්වන ලද කාර්යමණ්ඩලය පුහුණු කිරීමේ වැඩසටහන් සම්බන්ධ විස්තර පහත වගු අංක - 8 මගින් ඉදිරිපත් කරනු ලැබේ.

වගුව - 8 : 2019 වර්ෂය තුළ පවත්වන ලද කාර්යමණ්ඩලය පුහුණු කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන්

අංකය	පුහුණු වැඩසටහන	සහභාගි වූ ගණන
01	කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්බන්ධ සම්මන්ත්‍රණය (දෙමළ මාධ්‍යය) – 2018	100
02	පාරිභෝගික කටයුතු වැඩිදියුණු කිරීම සහ විශිෂ්ඨ කිරීම, කොරියාවේදී	02
03	වෘත්ති ගවේෂණය, (AAP)	01
04	වෙළඳාම සහ සංවර්ධනය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD), ජිනීවාහිදී	01
05	රාජ්‍ය මුදල් රෙගුලාසි, (මිලෝඩාව)	02
06	ප්‍රවාහන කළමනාකරණය සම්බන්ධ වැඩමුළුව, (SDFL)	01
07	චීනය සහ ශ්‍රී ලංකාව අතර ව්‍යාපාරික සංස්කෘතිය හුවමාරු කරගැනීම සම්බන්ධ සම්මන්ත්‍රණය, චීනයේදී	01
08	සේවය අවසන් කිරීම (කම්කරු අධ්‍යාපනය සම්බන්ධ ජාතික ආයතනය)	01
09	වැටුප් පරිවර්තනය සම්බන්ධ දෙදින වැඩමුළුව, ඩී ඇන්ඩ් ආර් ප්‍රොෆෙෂනල් ඩිවලොප්මන්ට් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්	02
10	ඵලදායි ඉදිරිපත් කිරීමේ හැකියා සම්බන්ධ දෙදින වැඩමුළුව, ශ්‍රී ලංකා පදනම් ආයතනය	04
11	හරස් ප්‍රශ්න ඇසීම සම්බන්ධ සහතිකපත්‍ර පාඨමාලාව (ප්‍රායෝගික පුහුණුව - සති 8), ශ්‍රී ලංකා නීතිඥවරුන්ගේ සංගමය	02
12	වියදම් හා ගෙවීම් පරිපාටිය සහ මූල්‍ය රෙගුලාසි, PRAG ආයතනය	05
13	කළමනාකරණ සහ පර්යේෂකයින් සඳහා මූලික සංඛ්‍යාලේඛන, ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යාලේඛන ආයතනය	02
එකතුව		124

ආ. අධිකාරියේ කාර්යමණ්ඩලයේ තත්ත්වය ශක්තිමත් කිරීම

ඇ. <u>කාර්යමණ්ඩලය අභිප්‍රේරණය සහ සුභසාධනය</u>

කාර්යමණ්ඩලය සඳහා ප්‍රසන්න සහ චර්යාමත් වැඩ කරන පරිසරයක් ලබාදීම පිණිස වර්ෂය තුළ වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමයක්, සංස්කෘතික සහ ආගමික වැඩසටහන්, කාර්යමණ්ඩලය සංවර්ධන වැඩසටහන්, සේවකයින් හඳුනා ගැනීම වැනි පියවර කිහිපයක් ගන්නා ලදි.

ඇ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම

නීතිපති දෙපාර්තමේන්තුවේදී ගරු නීතිපතිවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පරිපාලනමය වශයෙන් ක්‍රියා කරනු ලබන්නේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යටතේ වන අතර, ප්‍රති-තරඟකාරි පරිචයන්ට අදාල ක්ෂේත්‍රය ප්‍රධාන කොට ගෙන අධිකාරිය විසින් සභාව වෙත කරනු ලබන යොමු කිරීම්වලට සවන්දීම සහ ඒ සම්බන්ධ තීරණ ගැනීමේ බලය පනත මගින් පවරා ඇත. පනතේ විධිවිධාන ප්‍රකාරවඃ අසාධාරණ මිළ ගණන්, වෙළඳපොල අඩුපාඩු සහ වෙළඳපොල හැසිරීම්ද විමර්ශනය කිරීම සඳහා සභාව වෙත යොමු කරනු ලැබේ. අවශ්‍ය වුවහොත් භාණ්ඩ විකිණිය යුතු හෝ සේවාවන් ලබාදිය යුතු උපරිම මිළ නිර්දේශ කිරීමේ බලයද මෙම සභාවට පවරා ඇත.

පැමිණිලි/ යොමු කිරීම්

ක්‍රියාකාරකම්	ප්‍රගතිය
මහජන යහපතට එරෙහිව ක්‍රියාත්මක වන ප්‍රති - තරඟකාරී පරිචයන්ට විරුද්ධව කටයුතු කිරීමට වගබලා ගැනීම	01 - විසඳීමට තිබෙන
භාණ්ඩ හා සේවාවන්හි උපරිම මිළ නිර්දේශ කිරීම	05
අසාධාරණ මිළ ගණන් සම්බන්ධ විමර්ශනය කිරීම්	02

2019 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය

වත්කම්	2019.12.31 දිනට ශ්‍රී ලංකා රුපියල් 000'	2018.12.31 දිනට ශ්‍රී ලංකා රුපියල් 000'
ජංගම වත්කම්		
මුදල් හා මුදල් සමාන අයිතම	74,663	70,602
වෙළඳ සහ අනිකුත් අය විය යුතු දෑ	35,667	31,280
බඩු වට්ටෝරු / තොග	2,710	2,122
අනිකුත් ජංගම මුල්‍ය වත්කම්	10,980	10,481
	124,020	**114,485**
සිදුකෙරෙමින් පවතින වැඩ (සංවර්ධන අදියර)	1,376	138
ජංගම නොවන වත්කම්		
ආයෝජන	306,380	275,777
පාරිතෝෂික අරමුදල් ආයෝජන ගිණුම	54,234	31,530
අනිකුත් ජංගම නොවන මුල්‍ය වත්කම් (කාර්යමණ්ඩලය සඳහා ණය)	17,800	18,370
කුලියට ගත් ගොඩනැගිල්ල	775	800
දේපළ, පිරියත සහ උපකරණ	82,688	87,671
	461,877	**414,149**
මුළු වත්කම්	**587,273**	**528,772**
බැරකම්	-	
ජංගම බැරකම්		
උපචිත වියදම්	54,320	43,749
ගෙවිය යුතු මුදල් සහ අනිකුත් බැරකම්	6,249	10,394
	60,569	**54,143**
ජංගම නොවන බැරකම්		
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	79,620	67,927
මුළු බැරකම්	**140,189**	**122,069**
මුළු ශුද්ධ වත්කම්	**447,084**	**406,702**

ශුද්ධ වත්කම් / හිමිකම්		
සමුච්චිත අරමුදල	63,191	63,191
විලම්බිත ආදායම	14,241	35,017
සංචිත	369,651	308,494
	447,084	**406,702**
මුළු ශුද්ධ වත්කම් / සමකොටස්	**447,084**	**406,702**

ගිණුම් ප්‍රතිපත්ති සහ ගිණුම්කරණ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනුකලන කොටසක් සාදයි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරනු ලැබේ.

....
මූල්‍ය අධ්‍යක්ෂ
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

....
අධ්‍යක්ෂ ජනරාල්
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

....
සභාපති
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

	2019.12.31 දිනට ශ්‍රී ලංකා රුපියල් 000'	2018.12.31 දිනට ශ්‍රී ලංකා රුපියල් 000'
ආදායම්		
පුනරාවර්තන ප්‍රදානයන්	502,975	489,982
දඩ මුදල් ආදායම්	39,094	32,910
අනිකුත් ආදායම්	67,380	58,883
	609,449	**581,775**
වියදම්		
පුද්ගලික පඩිනඩි	(385,263)	(376,770)
ප්‍රවාහන	(15,312)	(12,109)
සැපයුම් සහ පරිභෝජන භාණ්ඩ	(10,602)	(10,353)
නඩත්තු කටයුතු	(9,668)	(7,567)
ගිවිසුම් ගත සේවා	(67,884)	(53,516)
ක්ෂය කිරීම්	(32,123)	(27,466)
අනිකුත් මෙහෙයුම් වියදම්	(44,152)	(31,099)
මූල්‍ය පිරිවැය	(204)	(150)
මුළු වියදම්	**(565,208)**	**(519,030)**
වර්ෂය සඳහා මුළු ශුද්ධ අතිරික්තය /(ඌනතාවය)	**44,242**	**62,746**
අනිකුත් විස්තීර්ණ ආදායම්		
ප්‍රත්‍යාගණන ලාභය	16,916	38,815
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	**61,157**	**101,561**

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2019 ශ්‍රී ලංකා රුපියල් 000'	2018 ශ්‍රී ලංකා රුපියල් 000'
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම්		
සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් අතිරික්තය / (ඌනතාවය)	**44,242**	**62,746**
ගැලපීම්		
අපහරණය කරන ලද වත්කම් සඳහා ලැබීම්	22	-
ක්ෂය කිරීම්	32,123	27,466
පාරිතෝෂික ප්‍රතිපාදන	13,602	20,603
ක්‍රමක්ෂය කිරීම්	25	25
කාරක ප්‍රාග්ධන වෙනස් කිරීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**90,014**	**110,840**
ගෙවිය යුතු මුදල්වල වැඩිවීම - සටහන I	6,427	2,172
අනිකුත් ජංගම වත්කම්වල වැඩිවීම - සටහන II	(5,474)	(3,634)
පාරිතෝෂික ගෙවීම්	(1,909)	(2,106)
සිදුකෙරෙමින් පවතින වැඩවල අඩුවීම/ වැඩිවීම	(1,239)	(154)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම	**87,819**	**107,118**
අයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම		
පිරියත සහ උපකරණ මිළට ගැනීම්	(10,246)	(9,506)
පාරිතෝෂික අරමුදල ආයෝජනය කිරීම	(22.704)	(10,898)
ආයෝජනවල වැඩිවීම	(30,602)	(45,257)
දීර්ඝ කාලීන ණයවල (කාර්යමණ්ඩලය සඳහා ණය) අඩුවීම	570	(5,507)
අයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම	**(62.982)**	**(71,168)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම		
භාණ්ඩාගාර ප්‍රදානයන් - ප්‍රාග්ධන	11,348	9,801
ක්ෂය කිරීම්	(32,124)	(27,466)
විලම්බිත ආදායම	**(20,776)**	**(17,665)**

මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම්	**(20,776)**	**(17,665)**
මුදල් හා මුදල් සමාන අයිතමවල ශුද්ධ අඩුවීම / (වැඩිවීම)	**4,061**	**18,285**
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන අයිතම	**70,602**	**52,317**
කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන අයිතම	**74,663**	**70,602**

2019.12.31 දිනට සමකොටස්වල වෙනස්වීමේ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රුපියල් 000

විස්තරය	ආයතනයේ හිමිකරුවන්ට පැවරිය හැකි			
	දායකත්ව ප්‍රාග්ධනය	සමුච්චිත අතිරික්තය/ ඌනතා	ප්‍රත්‍යාගණන අතිරික්තය	මුළු ශුද්ධ වත්කම්/ සමකොටස්
2019.01.01 දිනට ශේෂය	**35,017**	**329,727**	**38,815**	**403,559**
ප්‍රති-ඇස්තමේන්තුගත ලාභය (2018)		3,143		**3,143**
නැවත සඳහන් කරන ලද (Restated) ශේෂය	**35,017**	**332,870**	**38,815**	**406,702**
2019 වර්ෂයේ ශුද්ධ වත්කම්වල/ සමකොටස්වල වෙනස්වීම්				
දායකත්ව ප්‍රාග්ධනය - භාණ්ඩාගාරය	11,348			**11,348**
විලම්බිත ආදායම ක්‍රමක්ෂය කිරීම	(32,123)			**-32,123**
වර්ෂය සඳහා අතිරික්තය/ ඌනතාවය		44,242		**44,242**
			16,916	**16,916**
2019.12.31 දිනට ශේෂය	**14,242**	**377,112**	**55,731**	**447,084**

ගිණුම් සඳහා සටහන්

ඒකාබද්ධ තොරතුරු

1.1 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ පනත මගින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ස්ථාපනය කොට ඇත්තේ 1979 අංක 01 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත, 1987 අංක 01 දරණ සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ මිළ පාලන පනත (173 වෙනි පරිච්ඡේදය) යන පනත් අවලංගු කරමිනි. 2011 සැප්තැම්බර් 15 දිනැති අංක පීඊඩී/58/02 දරණ රාජය ව්‍යවසාය චක්‍රලේඛයට අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය නියාමන නියෝජිතායතනවල කාණ්ඩයට අයත් ආයතනයන් ලෙස "A" වර්ගීකරණය ඇත.

1.2 **ප්‍රමුඛ කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය**

අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ වෙළඳාම නියාමනය කිරීම ය.

1.3 2019 වර්ෂයේ අග වනවිට අධිකාරියේ සේවකයින් ගණන 538 ක් විය.

1.4 **වැදගත් කොටස් හිමිකාරීත්වය / හිමිකම්**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රතිපාදන ලබාදෙන්නේ භාණ්ඩාගාරය විසිනි. දඩ මුදල් ආදායමෙන් 1/3 ක් සහ වෙළෙඳුන් දැනුවත් කිරීම සඳහා පවත්වනු ලබන දැනුවත් කිරීම් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු මගින් සාදනු ලබන අරමුදලේ ශුද්ධ ශේෂයද අධිකාරියේ සමකොටස් මගින් නියෝජනය කරනු ලබයි.

1.5 **රජයේ ප්‍රදාන**

රජය මගින් ලබාදෙන ප්‍රතිපාදන හඳුනාගනු ලබන්නේ එකී ප්‍රදානයන් ලබෙනු ඇති බවට සාධාරණ සහතිකවීමක් තිබෙන නිසාය. ප්‍රදානය වියදමකට අදාල වනවිට එය වර්ෂය සඳහා ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රදානය වත්කමකට අදාල වනවිට එය අදාල වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය මත සමාන සංඛ්‍යාවලින් ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට මූල්‍ය නොවන වත්කම්වලින් ප්‍රදානයන් ලැබෙනවිට වත්කම් සහ ප්‍රදානයන් නාමමාත්‍ර වටිනාකම්වලින් වාර්තාගත කරනු ලබන අතර, පාදක වූ වත්කමේ ප්‍රතිලාභයේ පරිභෝජන රටාවක අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයුකාලය මත ලාභයට හෝ අලාභයට සමාන වාර්ෂික වාරිකවලින් නිදහස් කරනු ලැබේ. වත්කම්වලට අදාල රජයේ ප්‍රදානයන් සහ සාධාරණ අගයක මූල්‍ය නොවන ප්‍රදානයන් ශේෂ පත්‍රයේ විලම්බිත ආදායම ලෙස ඉදිරිපත් කර ඇත.

2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති කමිටුව විසින් නිකුත් කොට ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය සහ ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වෙනස්කිරීමේ පෙරදිසි හඳුනා ගැනීම මත පදනම් කරගෙන ය.

2.3 දඩ මුදල් ආදායම

2.3.1 දඩ මුදල්වලින් උපයන ලද ආදායම් අධිකාරියේ පොදු ක්‍රියාකාරකම් සඳහා ප්‍රයෝජනයට නොගන්නා ලදින් ඒවා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් කල් ඇතිවම බැහැර කරන ලදි. 2011 වර්ෂයේ සිට ඉදිරියට මෙම ආදායම ප්‍රයෝජනය ගනු ලැබුවේ මහා භාණ්ඩගාරයේ හෝ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ය. ඒ අනුව, දඩ මුදල් ආදායමක් ලෙස සලකනු ලබන අතර, දඩ මුදල් සඳහා අදාල සියලූම වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පෙන්වා ඇත.

2.2.2. දඩ ආදායම් වශයෙන් ලැබෙන එහෙත් එම අවස්ථාවේදී නඩු අංක සහ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අදාල වැටලීම් නිලධාරීන් විසින් දෙනු ලබන අදාල තොරතුරු සහ, ඒවායේ ප්‍රේෂණ සමඟ අදාල උසාවි විසින් දෙනු ලබන නඩු අංක සහ තොරතුරු හේතුකොට ගෙන අධිකාරිය වෙත ලැබෙන මුදල් හඳුනාගත නොහැකිවූ අවස්ථා ඇත. ඒවා සත්‍ය වශයෙන්ම අධිකාරියට යෝග්‍ය මුදල්ද නැතහොත් උසාවි විසින් වැරදීමකින් ප්‍රේෂණය කරන ලද මුදල්ද යන්න සත්‍යායනය කිරීමේ කාර්යය පිණිස, සාමාන්‍යයෙන් අවිනිශ්චිත දඩ මුදල් ගිණුමට මාරු කරනු ලැබේ. එවැනි මුදල් ඊළඟ වර්ෂාවසානය දක්වා හඳුනා නොගත් මුදල් වශයෙන් පැවතියහොත් ඒවා අධිකාරියේ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ අරමුදලට බැර කරනු ලැබේ.

2.2.3 අතීත අත්දැකීම්වලට අනුව හඳුනානොගත් සියලූම දඩ මුදල් ආදායම් සම්පූර්ණයෙන්ම පාහේ අයවිය යුතු දඩ මුදල් පිළිඹිඹු කරනු ලබන බව නිරීක්ෂණය කරනු ලැබේ.

2.4 මූල්‍ය වර්ෂය

අධිකාරියේ මූල්‍ය වර්ෂය දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන ලිත් අවුරුද්ද වේ.

3. වත්කම් පදනම සහ ඒවායේ අගය තක්සේරු කිරීම

3.1 දේපළ, පිරියත සහ උපකරණ

3.1.1 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය ලෙස සහ ගිණුම් ඇස්තමේන්තු කිරීම සඳහා අධිකාරිය විසින් පිරිවැය ආදර්ශය තෝරාගනු ලැබේ. (SLPSAS 7)

3.1.2 දේපළ, පිරියත සහ උපකරණ (PPE); පිරිවැය, දේපළ සහ පිරියතවල සංචරක කොටස් ප්‍රතිස්ථාපනය කිරීම ඇතුළත් සමුච්චිත ක්ෂය කිරීමේ ශුද්ධ අගය මත සඳහන් කරනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණවල සුවිශේෂී කොටස් ප්‍රතිස්ථාපනය කළ යුතු අවස්ථාව වනවිට, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ප්‍රතිස්ථාපනය කරන ලද කොටස වෙනම හඳුනාගෙන සහ, අලූත් කොටසේ ස්වකීය*ආශ්‍රිත ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ක්ෂය කිරීම හඳුනාගනු ලබයි. අලූත්වැඩියා සහ නඩත්තු පිරිවැය, දරනු ලබන පරිදි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

යම් ප්‍රත්‍යාගණන පිරිවැයඃ වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයන්හි සමුච්චිත සමකොටස්වලදී හඳුනාගනු ලැබේ.

3.1.3 දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැයඃ මිළදී ගැනීම්වල හෝ වත්කම්වලින් අපේක්ෂිත ප්‍රයෝජනය සඳහා ඒවා වැඩකළ හැකි තත්ත්වයට ගෙනඒමේදී දැරීමට සිදුවන සහ හටගන්නා යම් විදයමක් වේ.

3.1.4 ව්‍යාපාරය කරගෙන යාමේ හෝ වත්කම්වල ආයු කාලය වැඩිකිරීමේ අර්ථයෙන් ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීමේ, වැඩි කිරීමේ හෝ වැඩිදියුණු කිරීමේ කාර්යය පිණිස දැරීමට සිදුවන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

3.1.5 සිදුකෙරෙමින් පවතින වැඩ

මෙය කාර්යාල බෙදීම් සඳහා දැරීමට සිදුවන වියදමෙහි පහත පරිදි ඉදිරිපත් කරනු ලැබේ.

	ඇස්තමේන්තුගත මුළු පිරිවැය	2019.12.31 දිනට සම්පූර්ණ කරන ලද/සහතික කරන ලද (රු.)	කරන ලද ගෙවීම්	ගෙවිය යුතු මුදල්වල ශේෂය
කාර්යාල බෙදීම් - අනුරාධපුරය	1,376,300.00	755,846.74	-	1,376,300.00
එකතුව	**1,376,300.00**	**755,846.74**		**1,376,300.00**

3.2 ක්ෂය කිරීම

අත්පත් කරගනු ලබන සියලුම වත්කම් ප්‍රයෝජනයට ගතහැකි මාසයේ සිට අධිකාරිය විසින් ක්ෂය කරනු ලැබේ.

3.2.1 දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම සපයා ඇත්තේ ස්ථිර පදනම මත වන බැවින් ඒවායේ පිරිවැය, තක්සේරු කළ ආයු කාලය මත පහත පරිදි කපා හරිනු ලැබේ.

කාර්යාලීය ගෘහ භාණ්ඩ සහ උපකරණ	10%
කාර්යාලීය උපකරණ	10%
පරිගණක උපකරණ	20%
පරිගණක මෘදුකාංග සහ වෙබ් අඩවිය නිර්මාණය කිරීම (අස්පර්ශනීය වත්කම්)	20%
මෝටර් වාහන	20%
කාර්යාලීය අභ්‍යන්තර බෙදීම්	20%
පරිභෝගික නොවන භාණ්ඩ	10%

3.2.2 ක්ෂය කිරීම් ගණනය කිරීමේදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සෘජු ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබයි.

3.2.3 පුස්තකාල පොත් සඳහා ක්ෂය කිරීම් සිදුකරන්නේ නැත.

3.2.4 සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය කිරීම්වල වටිනාකම විලම්බිත ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ.

3.3 ගොඩනැගිලි පරිශ්‍රය - කුරුණෑගල

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කුරුණෑගල කාර්යාලය සඳහා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවරා ඇති ගොඩනැගිලි පරිශ්‍රය වෙනුවෙන් වසර 40 කට අධික කාලයක් පුරා රුපියල් මිලියනයක මුදලක් ක්‍රමක්ෂය කරනු ලැබේ.

3.4 ණයගැතියන් සහ ලැබිය යුතු මුදල්

ණයගැතියන් සහ ලැබිය යුතු මුදල් සඳහන් කරනු ලබන්නේ ඒවා උපලබ්ධිවීමට ඇස්තමේන්තුගත වටිනාකමට ය.

3.4 **මුදල් සහ මුදල් සමාන අයිතම**

මුදල් සහ මුදල් සමාන අයිතම අර්ථ දක්වනු ලබන්නේ මුදල, අත ඉතුරු මුදල්, බැංකුවේ තැන්පත් කර ඇති මුදල් සහ කෙටි කාලීය ආයෝජන වශයෙනි.

3.5 මුදල් ගැලීම් ප්‍රකාශනයේ කාර්යය පිණිසඃ මුදල් සහ මුදල් සමාන අයිතම සමන්විත වන්නේ අත ඉතුරු මුදල් සහ බැංකුවේ තැන්පත් කර ඇති මුදල්වලිනි.

3.6 **ස්ථාවර තැන්පතු**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සතු ස්ථාවර තැන්පතු වර්ගීකරණය කරනු ලබන්නේ ආයෝජන යටතේ ය. ස්ථාවර තැන්පතු නියමිත කාලය තුළ ආපසු නොගැනීමේ අත්දැකීම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට තිබෙන බැවින් ස්ථාවර තැන්පතුවලින් බහුතර ගණනක් වසර 3 ක කාලයක් පවතින බවට උපකල්පනය කරනු ලැබේ. ස්ථාවර තැන්පතු මූලිකව මනිනු ලබන්නේ පිරිවැය කෙරෙහි ය.

4. වගකීම් හා ප්‍රතිපාදන

4.1 **ගෙවිය යුතු මුදල්**

ගෙවිය යුතු මුදල් සඳහන් කරනු ලබන්නේ ඒවායේ පිරිවැය මත ය.

4.2 **විශ්‍රාම ප්‍රතිලාභ සම්බන්ධ බැඳීම**

නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම් දෙකක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සතුව තිබෙන අතර, ඒ දෙකම සඳහා දායකත්ව මුදල් බැර කළ යුතු ය.

4.2.1 නිශ්චිත ප්‍රතිලාභ සැලස්ම - පාරිතෝෂික දීමනා

නිශ්චිත ප්‍රතිලාභ සැලස්ම වන්නේ නිශ්චිත දායකත්ව සැලැස්මට වඩා පශ්චාත් සේවානියුක්ති ප්‍රතිලාභ සැලැස්ම ය. 2018 වර්ෂයේ සිට පාරිතෝෂික බැඳීම ගණනය කරනු ලැබුවේ ශ්‍රී ලංකා ගි.ප්‍ර. (LKAS) 19 සේවක ප්‍රතිලාභී ක්‍රමය මගින් ඉල්ලා ඇති පරිදි දැනට සිටින සියලූම සේවකයින් සඳහා සූත්‍ර ක්‍රමය භාවිතා කරමින් ය. ශ්‍රී ලංකා ගි.ප්‍ර. LKAS 19 සේවක ප්‍රතිලාභ ක්‍රමයට අනුකූලව සියලූම සේවකයින් සඳහා සේවය ආරම්භයේ සිට විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන ලබාදී ඇත. කෙසේ වෙතත් 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ආයතන සඳහා සේවකයෙකු මත බැඳීම හටගන්නේ වසර 5 අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ පසුව ය.

නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන ව්‍යවහාර මුදලට බලපානු ලබන පොලී අනුපාතයන් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගැලීම් වට්ටම් කිරීම මගින් සහ, අදාල බැඳීමේ කොන්දේසිවලට ආසන්න ලෙස කල්පිරීමට තිබෙන කොන්දේසිවලට අනුකූලව ය. නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම රඳා පවතින්නේ කල්පිත ගණන භාවිතා කරමින් සූත්‍රයක් පදනම් කරගෙන තීරණය කරනු ලබන සාධක ගණනාවක් මත ය.

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා 2019 දෙසැම්බර් 31 දින වනවිට සියලූම සේවකයින් වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනවල වටිනාකම රු. 79,619,868.56 ක් විය. නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම තීරණය කිරීමට යොදා ගන්නා ලද ප්‍රධාන කල්පත පහත පරිදි වේ. මෙකී කල්පිතවලට සිදුකරනු ලබන යම් වෙනස් කිරීම් නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ ධාරණ වටිනාකමට බලපෑමක් සිදුකරනු ඇත.

	2019
වට්ටවම් පොලී අනුපාතය	10.23%
වැටුප් වර්ධක අනුපාතය	10.00%
කාර්යමණ්ඩල පිරිවැටුම් අනුපාතය	7.00%
විශ්‍රාම ගැන්වීමේ වයස	අවුරුදු 60

පාරිතෝෂික ප්‍රතිපාදන වෙනම ආයෝජනය කිරීම පිණිස අනුමැතිය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ලබාගෙන ඇත. පාරිතෝෂික සඳහා ආයෝජනය කිරීම ගණනය කර ඇත්තේ අවුරුදු පහට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා ය. පහතින් දැක්වෙන්නේ 2019.12.31 දිනට පාරිතෝෂික ආයෝජනයේ සහ ආයෝජනය කළ යුතු ශේෂයේ සාරාංශය වේ.

2019.12.31 දිනට වසර 5 කට වැඩි සේවා කාලයක් සහිත සේවකයින්ගේ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		666,809,002
2019.01.01 දිනට කරන ලද ආයෝජනය	54,234,062	
2019 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන (2020.02.28 දිනට පෙර ආයෝජනය කළ යුතු ය	12,574,940	
මුළු ආයෝජන		**666,809,002**

4.2.2 නිශ්චිත දායකත්ව සැලසුම් / සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල. අනුපිළිවෙල ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල සඳහා දායකත්වය ලැබීමට සියලුම සේවකයින් සුදුසුකම් ලබති. සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල සඳහා ආවරණය වන සේවකයින්ගේ දායකත්ව මුදල් ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සේවකයින්ගේ දළ වැටුපෙන් පිළිවෙලින් 15% ක සහ 3% ක ප්‍රතිශතයක් වශයෙන් දායක කරනු ලැබේ.

4.3 අවිනිශ්චිත වගකීම්

4.3.1 2019.12.31 දින වනවිට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට විරුද්ධව නඩු 42 ක් අධිකරණයේ පවරා තිබුණු අතර, මෙම නඩු සඳහා පෙනී සිටි අධිකරණය අනුව පහත පරිදි වර්ග කරනු ලැබේ.

අධිකරණය	නඩු ගණන
ශ්‍රේෂ්ඨාධිකරණය	04
අභියාචන මහාධිකරණය	25
මහාධිකරණය	06
දිස්ත්‍රික් උසාවිය	05
කම්කරු විනිශ්චය සභා	01
බේරුම්කරණය	01
එකතුව	42

මෙම නඩුවලින් වැඩි ගණනක් උසාවියේ පවරා තිබුණේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පාරිභෝගිකයින් වෙනුවෙන් දෙනු ලැබූ තීරණවලට විරුද්ධව ය. සමහර නඩු පවරා තිබුණේ ප්‍රසිද්ධ කරන ලද ගැසට් හෝ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගැසට් කරන ලද ඡේදයකට විරුද්ධව ය. කෙසේ වෙතත්, අවිනිශ්චිතතාවයේ වටිනාකම ගණනය නොකරන ලද අතර, පීඩාවට පත් බොහෝ පාර්ශවයන් විසින් අධිකාරියේ තීරණය අවලංගු කරනු ඇතැයි සහ ප්‍රසිද්ධ කරන ලද ගැසට් සංශෝධනය හෝ අවලංගු කරනු ඇතැයි අපේක්ෂාවෙන් සිටිති.

4.3.2 පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම පිණිස, හඳුනාගත් සමහර නිෂ්පාදන සඳහා තාක්ෂණය පදනම් කරගත් පාරිභෝගික ආරක්ෂණ ව්‍යාපෘතියක් (secure tracking & tracing system) ක්‍රියාත්මක කිරීමට යෝජිත සමාගම වන SICPA ආයතනය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අතර අත්සන කරන ලද ගිවිසුම ප්‍රකාරව අධිකාරිය විසින් එකී ගිවිසුම ක්‍රියාත්මක නොකිරීම හේතුකොට ගෙන හටගත් ආරවුල නිරාකරණය කරදෙන ලෙස ඉල්ලමින් ඉහත කී SICPA ආයතනය විසින් ඉල්ලුම්පත්‍රයක් ගොනු කර ඇත.

ක්‍රියාත්මක නොකිරීමට හේතුව

නියෝගය (2014.02.24 දිනැති අංක 49 දරණ නියෝගය) නිකුත් කිරීමෙන් පසුව, නිරූපිත නිෂ්පාදනවල නිෂ්පාදක විසින් නියෝගය සම්බන්ධයෙන් ඔවුන්ගේ සැලකිල්ල පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට දැනුම්දී ඇති අතර, ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක්ද පවත්වා ඇත. පවත්වන ලද සාකච්ඡා සාර්ථක නොවූ නිසා නියෝගය ක්‍රියාත්මක නොකිරීමට විරුද්ධව ජලය බෝතල් කිරීමේ ශ්‍රී ලංකා සංගමය, බීම බෝතල් කිරීමේ සංගමය සහ විලවුන් නිෂ්පාදකයින් විසින් අභියාචන මහාධිකරණයේ ඉල්ලුම්පත්‍රයක් (CAA/Writ/281/2014) ගොනුකර ඇති අතර, එම නඩුව අභියාචන මහාධිකරණයේ තවමත් විභාග වෙමින් පවතී.

I. SICPA ආයතන විසින් ශ්‍රී ලංකා රුපියල් බිලියන 2.71 ක මුදලක් හෝ විකල්පයක් වශයෙන් ශ්‍රී ලංකා රුපියල් 3.887 ක මුදලක් හෝ විනිශ්චය සභාව විසින් තීරණය කරනු ලබන යම් වෙනත් ගණනක් සහ, හිමිකම් කියා සිටිනු ලබන හානි වෙනුවෙන් පොලියක් සහ බේරුම්කරණය වෙනුවෙන් දැරීමට සිදුවූ සියලූ වියදම් ලබාදෙන ලෙස අයැද සිටී.
   බේරුම්කරණය වෙනුවෙන් තාවකාලික අත්තිකාරම් භාගයක් ලෙස එක්සත් ජනපද ඩොලර් 230,000 ක මුදලක් ගෙවන ලෙස පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙන් ඉල්ලා ඇත.
II. බේරුම්කරණ නඩුව 2020.02.24 සිට 2020.03.04 දින දක්වා කොළඹ ACPL බේරුම්කරණ මධ්‍යස්ථානයේදී විභාග කරන ලදි.

5. ආදායම

ආදායම හඳුනාගැනීම

ආදයම හඳනාගනු ලබන්නේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මුදල් ගැලීමට සසම්භාවී ප්‍රමාණයට වන අතර, ආදායම විශ්වාසනීය ලෙස මැනිය හැක.

පොලී ආදායම

ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම ගණනය කරනු ලබන අතර, නාමමාත්‍රික පොලී අනුපාතය (NIR) භාවිතා කරමින් සටහන් කරනු ලැබේ. ස්ථාවර තැන්පතු සඳහා සාමාන්‍ය පොලී අනුපාතය 9.83% ක් වේ.

රජයේ ප්‍රදානයන්

රජයේ ප්‍රදානයන් ලැබුණ බවටත් ඒ හා බැඳුනු සියලුම කොන්දේසිවලට අනුකූලව කටයුතු කරනු ඇතැයි යන්න සාධාරණ සහතිකවීමක් සහිතව එකී ප්‍රදානයන් හඳුනාගනු ලැබේ. ප්‍රදානයන වියදම් අයිතමයකට (පුනරාවර්තන ප්‍රදානයන්) අදාල වන විටෙකදී එය කාලපරිච්ඡේදය සඳහා ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රදානයන් වත්කම් අයිතමකයකට (ප්‍රාග්ධන ප්‍රදානයන්) අදාල වන විටෙකදී එය අදාල වත්කමේ අපේක්ෂිත ආයු කාලය මත සමාන වටිනාකම්වලින් විලම්බිත ආදායමක් සහ නිදහස් කරන ලද ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

6. පෙර වර්ෂයේ ගැලපීම්

රුපියල් 671,434.65 ක් වූ පෙර වර්ෂයේ ගැලපීම් පහත පරිදි සමන්විත වේ.

ඉදිරිපත් නොකරන ලද චෙක්පත් අවලංගු කිරීම	3,100.00
උපචිත ගිණුම්වල ප්‍රතිපාදන යටතේ	(1,034,572.92)
උපචිත ගිණුම්වල ප්‍රතිපාදන මත	1,702,917.57
	671,434.65

මගේ අංකය / எனது இல. / My No. } පීසීඑම්/ඩී/සීජ්ජ්/1/19	ඔබේ අංකය / உமது இல. / Your No. }	දිනය / திகதி / Date } 2020 අගෝස්තු 28 දින

සභාපති,

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය නොකළ මතය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.
අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරියේ සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරි පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය වනවිට වසර 16 ක් ගත වී ඇතත් පනත සංශෝධනය කිරීමේ කටයුතු අවසන් වී නොතිබුණි. එම නිසා අධිකාරියේ කාර්යයන් වර්තමානයට ගැලපෙන ආකාරයට කරගෙන යාමට නොහැකිවී තිබුණි.

(ආ) 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ වූ ඉලක්කගත වැටලීම් ප්‍රමාණය 29,000 ක්වූ අතර එය මාසිකව එක් එක් දිස්ත්‍රික්ක සඳහා සංශෝධනය කර ඉලක්ක 26,405 දක්වා සංශෝධනය වී තිබුණි. 2017 වර්ෂයේ ඉලක්කගත වැටලීම 27,216 ක්වූ අතර 2018 දී එය 357 කින්ද 2019 දී 454 කින්ද අඩුවී තිබුණි. ඉකුත් වර්ෂයේ අධිකාරියට විමර්ෂණ නිලධාරීන් 213 ක්

අළුතෙන් බඳවාගෙන තිබියදීත් 2017 වර්ෂයට සාපේක්ෂව අඩු වැටලීම් ඉලක්කයන් ලබාදී තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය සඳහා එක් එක් දිස්ත්‍රික්ක සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකළ යුතු ප්‍රමාණය පිළිබඳ සැලැස්මක් පිළියෙල කර නොතිබුණු නමුත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී දැනුවත් කිරීමේ වැඩසටහන් 1,538 ක් සිදුකර තිබුණි. ඉන් ජනගහනය හා වෙළඳසැල් වැඩි ඒ හා බී කාණ්ඩයේ දිස්ත්‍රික්කවලට සාපේක්ෂව ජනගහනය හා වෙළඳසැල් අඩු සී හා ඩී කාණ්ඩයේ දිස්ත්‍රික්කවල දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩියෙන් සිදුකර තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අධිකාරියේ නීති අංශය වෙත යොමුවූ පැමිණිලි 1476 කින් පැමිණිලි 112 ක අනුකූල නොවීම සම්බන්ධව නීතිමය කටයුතු සඳහා යොමුවී තිබුණි.තවද එක් පැමිණිල්ලක් අනුකූල නොවීම සම්බන්ධව නීතිමය කටයුතු සඳහා යොමුවීමට නියමිතව තිබුණු අතර අදාල පාර්ශවකරුවන්ගෙන් ලැබිය යුතු තොරතුරු නොලැබීම මත පැමිණිලි 65 ක් නොවිසඳී තිබුණි. ඒ අනුව පැමිණිලි 492 ක විමර්ෂණ කටයුතු තවදුරටත් සිදුකළ යුතුව පැවති අතර ඉන් 2019 වර්ෂයට අදාලව පැවතියේ පැමිණිලි 136 ක් පමණි. 2015 වර්ෂයේ සිට 2018 වර්ෂයට අදාලව කාලපර්වඡේදයේ ලැබුණු පැමිණිලිවලින් 356 ක විමර්ෂණ කටයුතු තවදුරටත් සිදුකළ යුතුව පැවතුනි.

(ඉ) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අධිකාරියේ නීති අංශය වෙත යොමුවූ පැමිණිලිවලින් පැමිණිලි 202 ක් සම්බන්ධව සිදුකළ විමර්ශන වලදී දෙපාර්ශවය සමථයකට පත් නොවීම මත වගඋත්තරකරු වෙත නියෝග නිකුත් කිරීමට පරීක්ෂණ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව මෙම පැමිණිලි 202 න් 127 ක් සඳහා නියෝග නිකුත් කර එම නියෝග අදාල පාර්ශව වෙත දන්වා තිබුණි. එසේ වුවද පැමිණිලි 20 ක් සම්බන්ධයෙන් ලබාදී තිබුණු නියෝග අදාල පාර්ශව වෙත දන්වා නොතිබුණු අතර පැමිණිලි 55 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලය විසින් විගණිත දින වන විටත් නියෝග නිකුත් කර නොතිබුණි.

(ඊ) 2003 අංක 09 දරන පාරිභෝගික පිළිබඳ අධිකාරී පනතේ 13(4) වගන්තිය ප්‍රකාරව අධිකාරිය වෙත ලැබෙන පැමිණිල්ලක් විභාග කිරීමෙන් පසු, අවස්ථාවෝචිත පරිදි අතෘප්තියට පත් පාර්ශවයට වන්දි ගෙවන ලෙස හෝ යම් භාණ්ඩ ප්‍රතියෝජනය කරන ලෙස හෝ ඒ භාණ්ඩ සඳහා නැතහොත් සේවය සැපයීම සඳහා ගෙවන ලද මුදල ආපසු ගෙවන ලෙස අධිකාරිය විසින් ඒ සාදන්නාට හෝ වෙළෙන්දාට ලිඛිත ලියවිල්ලකින් නියම කළ යුතුය. එසේ වුවද, පරීක්ෂා කළ විමර්ෂණ ලිපිගොනු 08 කට අදාලව 2017, 2018 හා 2019

වර්ෂවලදී පැමිණිලිකාර පාර්ශවය වෙත එකතුව රු.717,993 ක්වූ වන්දියක් ගෙවන ලෙස වගඋත්තරකරුවන් වෙත නියම කර තිබුණි. එම නියෝග විගණිත දින වන විටත් අදාල පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ අත්සන් නොතිබීම හේතුවෙන් ලිපිගොනු 06 ක ලබාදී තිබුණු නියෝග අදාල පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(උ) අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි විමර්ෂණ කටයුතු සඳහා යොමු කිරීමෙන් පසු විමර්ෂණ කටයුතු සඳහා විශාල කාලයක් ගත වන අතර සාකච්ඡා හෝ පරීක්ෂණ වාර දෙකක් අතර මාස 06 ක් ඉක්මවන කාලයක් ගතවී තිබුණි. පැමිණිලිකරු, වගඋත්තරකරු හා අධිකාරියේ නිලධාරීන් විශාල කාලයක් කැප කරමින් පරීක්ෂණ කටයුතු සිදු කර තිබුණද පරීක්ෂණයේදී නිකුත් කළ නියෝග පරීක්ෂණ මණ්ඩලය විසින් අත්සන් නොකිරීම හා අදාල පාර්ශව වෙත දැනුම් නොදීම මත එම නියෝග ලිපිගොනුවලට පමණක් සීමාවී තිබුණු බැවින් 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරී පනතේ 13(5) හා 13(6) වගන්ති ප්‍රකාරව කටයුතු ඉටු කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ඌ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ පනතේ 8 (ඌ) වගන්තිය අනුව වෙළඳපොළ තත්ත්ව සහ පාරිභෝගික කටයුතුවලට අදාළව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පළ කිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම, අධිකාරියේ එක් කාර්යයක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් සිදු කරන ලද වෙළඳපොළ අධ්‍යයනවලට අදාළව සමාලෝචිත වර්ෂයේදි වාර්තා 5 ක් නිකුත් කර තිබුණි. ඉන් ආහාරයට සුදුසු තෙල් සම්බන්ධව සිදු කළ වෙළඳපොළ අධ්‍යයනයේදී හඳුනාගෙන තිබුණු පාරිභෝගික ආරක්ෂාවට හා සෞඛ්‍ය තත්ත්වයට හානිවන කරුණු සම්බන්ධයෙන් අධිකාරියේ අවධානය යොමු කර එම තොරතුරු මහජනතාව වෙත දැනුම් දීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(එ) සිමෙන්ති බ්ලොක්ගල් සහ වානේ කම්බි පිළිබඳ සිදු කළ අධ්‍යයන වලදී හඳුනාගත් ගැටළු හා එම ගැටළු විසඳීමට ඉදිරිපත් කල යෝජනා ඇතුළත් වාර්තාවන් අමාත්‍යංශයට යොමු කිරීම පමණක් සිදු කර තිබුණු අතර එම තොරතුරු මහජනතාවට සැපයීම හෝ මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු ආයතන දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව පිළිබඳව සභාපතිතුමාගේ අදහස් දැක්වීම

1. මූල්‍ය ප්‍රකාශන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති විසින් සකස්කොට ඇති තත්ත්වාගණනය නොකළ විගණන මතය සම්බන්ධව අවධානය යොමු කල අතර, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම සහ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම සම්බන්ධයෙන් වූ කරුණු කෙරෙහි ද මාගේ අවධානය යොමුකරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වූ විගණනකගේ නිරීක්ෂනයක්ද මා විසින් අධ්‍යනය කරන ලදුව ඒ පිළිබඳව අකාර්යක්ෂමතාවයක් වෙතොත් ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

3. අනිකුත් විගණන නිරීක්ෂණ

(අ) නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් 2019.08.19 දිනැතිව යොමු කරන ලද අවසාන කෙටුම්පතට නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඔවුන්ගේ නිරීක්ෂණ යොමු කර ඇත. සංශෝධන සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමට පෙර නීතිපති දෙපාර්තමේන්තුව සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින්, නව අමාත්‍ය මණ්ඩලයට අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් අදාල සංශෝධන ඉදිරිපත් කර නැවත අනුමැතිය ලබා ගත යුතු බවට දන්වා ඇත. මේ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පතක් සැකසූ අතර පනතේ සංශෝධන සමාලෝචනය පිණිස කමිටුවක් පත් කර යෝජිත සංශෝධන සමාලෝචනය කරන ලෙසට ගරු අමාත්‍යතුමන් විසින් උපදෙස් ලබා දී ඇත.

ආ) විමර්ශන නිලධාරීන් සඳහා රාජකාරි සිදුකිරීමට ඇති වපසරිය ඉතාමත් පුළුල් අතර වැටලීම් රාජකාරී යනු, එක් විෂය ක්ෂේත්‍රයක් පමණි. "වැටලීම් හා විමර්ශන, පාරිභෝගික හා වෙළඳ ප්‍රජාව දැනුවත් කිරීම, පාරිභෝගික පැමිණිලි විසඳීම, වෙළඳපල සමීක්ෂණ කටයුතු සිදුකිරීම, වැටලීම් වලට අදාළ උසාවි රාජකාරි සිදුකිරීම ආදී ප්‍රධාන කාර්යයන්ට අමතරව එකී රාජකාරීන්ට අදාළ ලිපි ලේඛන පිළියෙල කිරීම සහ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම ද ඇතැම් දිස්ත්‍රික්ක වල විමර්ශන නිලධාරීන් විසින්ම සිදුකරනු ලබයි." කාර්යාලීය අවශ්‍යතාවය මත මෙකී රාජකාරි සඳහා විමර්ශන නිලධාරීන් අනුයුක්ත කර ඇති බැවින් අනුයුක්ත කළ විමර්ශන නිලධාරීන් ගණන අනුව වැටලීම් ඉලක්ක තීරණය කළ නොහැක. වැටලීම් හා විමර්ශන රාජකාරි සඳහා පමණක් අනුයුක්ත කළ විමර්ශන නිලධාරීන් ගණන පදනම් කරගෙන ආයතනය ඒ ඒ කාලය සඳහා වූ අවශ්‍යතාවය අනුව වැටලීම් ඉලක්ක තීරණය කරනු ලබයි. ඒ අනුව ආයතනය සඳහා බඳවා ගන්නා ලද නව සේවකයින් ඉහතින් සඳහන් කළ අනෙකුත් රාජකාරි වල යොදවා ඇතිබව දැනුවත් කිරීම් දත්තවලින් පිළිබිඹු වේ. 2017 වර්ෂයට සාපේක්ෂව 2018 සහ 2019 වර්ෂ වලදී පාරිභෝගික දැනුවත් කිරීම් සංඛ්‍යාව වැඩි වී ඇති ආකාරය පහත සටහනින් පෙන්නුම් කෙරේ.

වර්ෂය	මහජන දැනුවත් කිරීම්	පාසැල් ළමුන් දැනුවත් කිරීම්	වෙළඳ ප්‍රජාව දැනුවත් කිරීම්	එකතුව
2017	255	105	214	574
2018	597	248	607	1452
2019	755	307	476	1538

තවද 2019 වසරේ පාස්කු ප්‍රහාරය හේතුවෙන් අප්‍රෙල් සහ මැයි මස රාජකරී අඩපන වීම හේතුවෙන් වැටලීම් ඉලක්ක සංශෝධනය කිරීමට ද හේතු විය. ඒ අනුව ල මෙයද සමස්ත ලෙස 2019 වසරේ 2017 හා 2018 වර්ෂවලට සාපේක්ෂව අඩු වැටලීම් ඉලක්කයක් ගණනය වීමට හේතු වී ඇත.

ඇ) C හා D කාණ්ඩයේ දිස්ත්‍රික්කවලට සිටිය යුතු අවම නිලධාරීන් ප්‍රමාණය හෝ නොසිටි නිසා අළුතින් බඳවාගත් විමර්ශන නිලධාරීන් මෙම C හා D කාණ්ඩයේ දිස්ත්‍රික් සඳහා අනුයුක්ත කොට තිබිණි.

නවක විමර්ශන නිලධාරීන් හට වෙළඳපල විමර්ශන හා වැටලීම් කටයුතු පිළිබඳ අත්දැකීම් නොමැත. ඒ අනුව නිලධාරීන් විමර්ශන හා වැටලීම් කටයුතු පිළිබඳ අත්දැකීම් ලබා ගන්නා තෙක්, ඔවුන්ගෙන් වැඩි සේවා ඵලදායිතාවයක් ලබා ගැනීමේ අරමුණින් අදාළ දිස්ත්‍රික්ක වල පාරිභෝගික අධිකාරියේ නීතිරීති පිළිබඳ අධ්‍යයනය කරමින් අත්දැකීම් සහිත නිලධාරීන් සමග දැනුවත් කිරීමේ කටයුතු සඳහා යොදවා තිබුණි.

එම නිසා A හා B කාණ්ඩයේ දිස්ත්‍රික්ක වලට සාපේක්ෂව C හා D කාණ්ඩයේ දිස්ත්‍රික්ක වල වැඩි දැනුවත් කිරීම් ප්‍රමාණයක් පෙන්නුම් කර ඇත.

(ඈ) 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පැමිණිළි 356ක විමර්ෂන කටයුතු සිදු කිරීමේදී යම් ප්‍රමාදයන් සිදු වී ඇති අතර ඊට හේතු පහත දැක්වේ.
ආයතයනට ලැබෙන පැමිණිලි සම්බන්ධව විධිමත් පරීක්ෂණ සිදු කරනු ලබන්නේ ආයතනයේ සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලයකින් සමන්විත පරීක්ෂණ මණ්ඩලයකින් වන අතර ආයතනයේ සභාපතිතුමා හා අධ්‍යක්ෂ මණ්ඩලය වරින් වර කිහිප විටක්ම වෙනස් වීම / නව පත්වීම් ලැබීම සහ සමහර කාලයන් වලදී දීර්ඝ කාලයක් අධ්‍යක්ෂ මණ්ඩලය පත් නොවීම යන හේතු මත විධිමත් පරීක්ෂණ කටයුතු වරින් වර අවලංගු කිරීමටත් කල් දැමීමටත් ලබා දෙන ඉදිරි දිනයන්ට පමණක් පරීක්ෂණ පැවැත්වීම සිදුකිරීමටත් සිදු විය.

(ඉ) 2015 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දින වන විට නියෝග නිකුත් කිරීමට තීරණය කළ පැමිණිලි 185ක් වූ අතර ඉන් පැමිණිලි 140 කට අදාළ නියෝග අදාළ පාර්ශව කරුවන් වෙත යොමු කර ඇත. තවත් ලිපි ගොනු 30කට අදාලව නැවත විධිමත් පරීක්ෂණ කටයුතු අරඹා ඇති අතර මේ වන විට පාර්ශව වෙත යොමු කර නොමැති ලිපිගොනු ඇත්තේ 14ක් පමණි.

(ඊ) වර්ෂ 2019.12.31 දින වන විට පාර්ශව වෙත නියෝග යොමු කර නොමැති ලිපිගොනු 14න් ලිපි ගොනු 08ක නියැදියක් පරීක්ෂා කිරීමෙන් එකතුව රු.717,993 ක් වූ වන්දියක් ගෙවන ලෙසට වග උත්තරකරුවන් වෙත නියම කර තිබුනද එම නියෝග විගනිත දින වන විටත් අදාල පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කර නොතිබූයේ අදාල නියෝග සඳහා පරීක්ෂණ මණ්ඩලයෙන් ඉවත්ව ගිය පූර්ණකාලීන සාමාජිකවරු දෙදෙනෙකුගේ අත්සන් සඳහා යොමු කර තිබූ බැවිනී. ඔවුන්ගේ අත්සන නොලැබීම මත ඒ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි පියවර ගැනීම පිළිබඳ අධිකාරියේ නව කළමණාකාරීත්වයේ අවධානය යොමු කර ඇත. එසේම තවත් නියෝග 2ක අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

(උ) අධිකාරියේ ඉහළ කළමණාකාරිත්වයේ සිදුවූ හදිසි වෙනස්වීම් මත අධිකාරියට ලැබෙනපාරිභෝගික පැමිණිලි විභාග කිරීම, අවසන් කිරීම හෝ අදාළ නියෝග නිකුත් කිරීම යන කාරණා සඳහා දීර්ඝ කාලයක් ගත වීම මත අධිකාරිය පණතේ 13(5) සහ 13(6) වගන්ති ප්‍රකාරව කටයුතු කිරීමට අපහසු වී ඇත. මෙලෙස විමර්ෂණ කටයුතු සඳහා දීර්ඝ කාලයක් ගතවීමට හේතු වශයෙන් පහත කරුණු හේතු වී ඇත.

- 2015 ජනවාරි 08 දින පැවැත්වීමට නියමිතව පැවති ජනාධිපතිවරණයට අපේක්ෂකයන් නම් කල පසු 2014 නොවැම්බර් සිට විධිමත් පරීක්ෂණ කටයුතු තාවකාලිකව නවත්වන ලෙසට අධිකාරියෙන් උපදෙස් ලැබුනි.
- 2015 වර්ෂයේදී ආයතනයේ සභාපති ධූරය අවස්ථා 03 කදී සභාපතිවරු 03 දෙනෙකු විසින් දරා ඇත.

- 2015.08.17 දින පැවැත්වීමට නියමිත මහ මැතිවරණය හේතුවෙන් විධිමත් පරීක්ෂණ කටයුතු තාවකාලිකව අවලංගු කරන ලෙසට අධිකාරියෙන් උපදෙස් ලැබී ඇත.
- 2017 වර්ෂයේ පැමිණිලි 11කට අදාලව විධිමත් පරීක්ෂණ පැවැත්වීමට දින නියම කර තිබුනද අධිකාරියේ උපදෙස් මත එම පරීක්ෂණ කටයුතු අවලංගු කර ඇත.
- 2018 වර්ෂයේ පැවැත්වීම සඳහා නියම කර තිබූ විධිමත් පරීක්ෂණ වාර 181ක් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල නොමැති වීම මත අවලංගු කර ඇත.
- 2019 වර්ෂයේදී අවස්ථා දෙකකදී සභාපති ධුරයන් වෙනස්වී ඇති අතර එම කාලයේදීද පැවැත්වීමට නියම කර තිබූ විධිමත් පරීක්ෂණ 07ක කටයුතු අධිකාරියෙන් ලද උපදෙස් මත අවලංගු කර ඇත.

මෙලෙස ආයතනයේ සභාපතිතුමා හා අධ්‍යක්ෂ මණ්ඩලය වරින් වර කිහිප විටක්ම වෙනස් වීම / නව පත්වීම් ලැබීම සහ සමහර කාලයන් වලදී සභාපති පත්කර තිබුනද දීර්ඝ කාලයක් අධ්‍යක්ෂ මණ්ඩලය පත් නොවීම යන හේතු මත විධිමත් පරීක්ෂණ කටයුතු වරින් වර අවලංගු කිරීමටත් කල් දැමීමටත් ලබා දෙන ඉදිරි දිනයන්ට පමණක් පරීක්ෂණ පැවැත්වීම සිදුකිරීමටත් සිදු වී ඇත.

(උ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ පනතේ 8 (උ) වගන්තිය අනුව වෙළඳපොල තත්ත්ව සහ පාරිභෝගික කටයුතුවලට අදාළව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පල කිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම අධිකාරියේ එක් කාර්යයක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් සිදු කරන ලද වෙළෙඳපොල අධ්‍යයනවලට අදාළව සමාලෝචන වර්ෂයේදී වාර්තා පහක් නිකුත් කර තිබුණි. ඉන් ආහාරයට සුදුසු තෙල් සම්බන්ධව සිදු කල වෙළෙඳපොල අධ්‍යයනයේදී මහාපරිමාණ කෑම පිසින හෝටල් සහ ආපනශාලාවලින් භාවිතා කොට ඉවත් කරන තෙල් වර්ග සහ අපිරිසිදු තෙල් වර්ග පිරිසිදු කර නැවත අසුරා නව නිෂ්පාදන ලෙස පාරිභෝගිකයා නොමග යවන අයුරින් අලෙවි කිරීම, පරිභෝජනය සඳහා යොදා ගන්නා තෙල් වර්ග, රසායනික ද්‍රව්‍ය ඇසුරුම් කළ බහාලුම් තුල හා ලිහිසි තෙල් ඉන්ධන තාර වැනි ද්‍රව්‍ය ඇසුරුම් කළ බහාලුම් තුළ පිරිසිදු කිරීමෙන් තොරව ගබඩා කරගැනීම තෙල් නිෂ්පාදනයේදී ඒ සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය ගුණාත්මක බැවින් අඩු නරක් වූ ඒවා වීම ෆාම් තෙල් වැනි ලාබදායී ප්‍රමිතියෙන් තොර හා භාවිතා කරන ලද තෙල් වර්ග මිශ්‍ර කොට අලෙවි කිරීම සහ 2016 ඔක්තෝබර් 7 දින අංක 1987/51 දරණ ගැසට් පත්‍රයේ දක්වා ඇති විදිවිධාන ක්‍රියාත්මක වීම අක්‍රීය මට්ටමේ පැවතීම ආදී ගැටළු හදුනාගෙන තිබිණ. මෙම ගැටළු පාරිභෝගික ආරක්ෂාවට හා සෞඛ්‍යතත්වයට හානිවන කරුණු බැව් අධිකාරිය විසින් හදුනාගත් හෙයින් ඒ සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

(ඌ) සිමෙන්ති බ්ලොක් ගල් සහ වානේ කම්බි පිළිබඳ සිදුකල අධ්‍යයන වලදී හදුනාගත් ගැටළු සහ එම ගැටළු විසඳීමට ඉදිරිපත් කල යෝජනා ඇතුලත් කල වාර්තාවක් අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි අමාත්‍යාංශයට යොමු කරන ලද අතර එම අධ්‍යයනයේදී හෙළි වූ ඇතැම් කරුණු සම්බන්දයෙන් මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.



මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික)
සභාපති